## IN THE COURT OF APPEAL OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of an application for a mandate in the nature of a writ of Mandamus in terms of Article 140 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

**W.Sudhesh Nandimal Silva**
**397/F,Rubberwatte Road,**
**Tissamaharama.**

**Petitioner**

**C.A. Application No:** CA writ 130/17

**Vs.**

1. Commissioner General of Prisons,
   Prison Head Quarters,
   Colombo 08.

2. Director
   Criminal Investigation Division
   Colombo 01.

3. Inspector General of Police
   Police Head Quarters
   Colombo 01

4. Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs
   356B, Carlwill Place,
   Galle Road, Colombo 03.

5. The Attorney General
   Attorney General Department
   Colombo 12.

**Respondents**

On this 4th day of April 2017

TO HIS LORDSHIP THE PRESIDENT AND OTHER HONORABLE JUDGES OF THE COURT OF APPEAL OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA.

The Petition of the Petitioner above named appearing by Senaka Perera his Attorney-at-Law respectfully states as follows:-

1. The Petitioner is 45 years of age and was an employee of the Railway Department from the year 1994 up to 2007. On 25.06.2007 he was arrested and charged under the Prevention of Terrorism Act (PTA) and was in remand custody at Welikada Prison from 2009.As the confessions were rejected by the High Court, the indictments were withdrawn by the Attorney General consequent to which the Petitioner was released from prison on19.09.2013.

2. While being in Remand custody the Petitioner was direct eye witness to the incidents that happened on 9th and 10th November 2012 in which 27 inmates of the Welikada prison were killed. The Petitioner wishes to bring to the attention to Your Lordships' Court what he saw and was within his personal knowledge of the said tragic incidents for the purpose of obtaining the reliefs prayed for in this Petition.

**THE INCIDENT**

3. On 9th November 2012 at about 1.00 pm the Petitioner and other prisoners at Welikada prison received information that personnel from the Army and STF were about to enter the prison to conduct a search operation. The Petitioner got to know that there was an argument between prison officials and a contingent of Terrorist Investigation Department (TID) Special Task Force (STF) waiting at the gate of the prison on the procedure related to the search operation. The prison officials had objected to the entry of TID and STF personnel armed with firearms without prior permission being sought and obtained. Petitioner learnt that the TID and STF officials insisted that this was an order issued by Secretary of Defense and therefore such protocols were not necessary. However, at this stage, the Chief Jailor Indika Sampath attached to the Intelligence and Security Division and presently an Assistant Superintendent of Prisons intervened and stated that he will take responsibility and to let the TID/STF inside. **THE PRISON OFFICIALS ON DUTY HAD LODGED A LOG ENTRY REGARDING THIS IRREGULAR INGRESS INTO THE PRISON BY OUTSIDERS.**

4. Soon after gaining entry into the Welikada prison, the STF/TID and prison Intelligence unit had gone into "L" hall and assaulted the prison inmates with the intention of provoking the prisoners. The petitioner and other prisoners heard the screaming of the prisoners. As the prisoners had not retaliated, they moved into the "Chapel Hall" where convicted prisoners were kept.

5. At this stage the STF and prison intelligence surrounded the building and they were carrying with them weapons and tear gas canisters. As tear gas was directed to even close by cells, several inmates fell down unconscious. Other inmates were rounded up and assaulted. This was going on for few hours. Some order was restored around 6.30 pm and the "L ward" cell and other cells were closed.

6. Around midnight the STF/TID and Prison Intelligence stormed inside the prison and started shooting. The Petitioner who was in the "L Hall" saw a prisoner named T.H.Lesely De Silva dead as a result of shooting. Petitioner and other prisoners got to know that, Jothipala, Kapila, Manjusri and Marlon were brought in from "Chapel Ward" (convicts) to the M ward and shot. Screaming and shouting were heard from these prisoners and they were shot dead. TID and Intelligence units gave updates of what was happening with the purpose of intimidating the prisoners.

7. The petitioner had seen an officer in yellow T-Shirt whom he later got to know as Rangajeewa former Narcotics Division of the Police with pistol in hand had asked for one Thushara alias Kalu Thushara. There were several prison officers including Commissioner General of Prisons P.W.Kodippili inside the prison at that time together with the said police Narcotics Unit officer Rangajeewa.

8. The petitioner saw Thushara being dragged to the floor and being shot near the gate. The petitioner had personally seen the body of Thushara next morning and the body had gunshot injuries in the neck. At about 6.00 am the petitioner and other prisoners saw Amila Malik Perera alias Konda Amila being taken in hand cuff and subsequently the petitioner got to know that Amila too had been killed.

9. The Petitioner states that the prison was in the control of the Army until 10.00 am on 10th November 2012. By that time 27 of the prison inmates had been killed by STF/Army/TID/Prison Intelligence. The Petition has made a complaint to the Criminal Investigation Department on 02.02.2015 regarding the said incident.

   **True copy of the said complaint dated on 02.02.2015 and the Receipt is annexed hereto marked as "P1" and "P1A" are pleaded as part and parcel hereof.**

10. It had also been reported that a store which contained prisoners' belongings including jewelries were to be handed over to the prisoners upon their release had also been ransacked and with many valuable items during this planned attack by STF, TID and Prison Intelligence .

THE AFTERMATH

11. There had been an inquest proceedings in Magistrate Court of Colombo Case No: B/6540/02/2012. However the said proceedings have not been concluded yet.

**True copy of the proceedings in the said case No: B/6540/2012 is annexed hereto marked as "P2" and is pleaded as part and parcel hereof.**

12. The petitioner states that there have been several commissions that had been appointed to inquire into the deaths in prison that occurred on 9th and 10th of November 2012. However none of these commissions had the mandate to investigate and prosecute the perpetrators. An organization formed to protect the intends of the prisoners, Committee for Protecting the Rights of Prisoners has published an index of the commissioners that were appointed by the authorities to inquire into the incident. Sadly the reports/decision of any of the said committee is not made available to the families of the dead prisoners or to the public.

**True copy of the said index is annexed hereto marked "P3" and pleaded as part and parcel hereof.**

13. The petitioner states that although 4 years has lapsed since the brutal killings of these prisoners no action has yet been taken by the police of the Attorney General to conduct the investigation and prosecute the offenders.

14. The Petitioner states that the said murders committed within the precinct of the Prison is the sole responsibility of the state and that investigation should have been initiated according to law immediately. However no such steps have been taken and this horrendous crime remain uninvestigated for the last four years.

15. The Petitioner state that, the deceased prisoners were kept in prison in fiscal custody on the orders of the judiciary. It is the judiciary which has the supreme duty to supervise, oversee and be in control of the affair pertaining to the prisoners. Often their application for bail is rejected by the judiciary and consequently their remand is extended. Therefore when the lives of prisoners are endangered, the Judiciary is under obligation to cause and investigation and inquiry into such incidents and make appropriate directions.

16. The Petitioner states that, in terms of Section 32(1) (b) of the Code of Criminal Procedure (CPC), the police have the duty to arrest without an order from a Magistrate and without a warrant any person *"is against whom a reasonable complaint has been made or credible information has been received or a reasonable suspicion exists of his having been so concerned".*

17. The Petitioner states that, the Petitioner has made a complaint to the police and has provided the names and designations of those who are suspected to have committed the offence and the police ought to have acted on the complaint and made immediate arrest of the persons against whom credible information has been received. The police on purpose and design have failed to act in terms of the law.

18. The petitioner states that the families of those who lost their lives in the said prison killings are aggrieved and good number of them have lost their bread winners. These family members urge that the incident be investigated into and properly inquired by the authorities. They are at a loss to understand why no investigation have been conducted into the massacre of their loved ones whom they expected to return to normal family lives after they served time in the Prison.

**Affidavits from some members of the families of the deceased annexed hereto marked "P4(a)", "P4(b)", "P4(c)", "P4(d)", "P4(e)", "P4(f)" and "P4(g)" respectfully and are pleaded as part and parcel hereof.**

19. The Petitioner states that the report recently issued by the UN High Commissioner for Human Rights has cited the Welikada Prison massacre among other emblematic cases in Sri Lanka and has drawn the attention of the GoSL that no justice has been done to the victims.

**A copy downloaded from the website of the Officer of the United Nations is annexed hereto marked "P5" and is pleaded as part and parcel hereof.**

20. The petitioner states that the Criminal Investigation Department and the Police Department have failed and neglected to perform their duties according to law and have failed even to launch the basic investigations leading up to the prosecution of offenders.

21. The Petitioner states that the conduct of the Prison Authorities in failing to prevent outsiders from entering the prison and committing the said atrocities should be made subject to credible investigation by the CID.

22. The Petitioner states that these incidents resulting in the loss of 27 lives within the Welikada Prison compound and whose lives were the responsibility of the Prison Authority is an everlasting stigma in the history of this country.

23. The Petitioner therefore seeks to invoke the jurisdiction of Your Lordships Court by way of a writ of Mandamus to Command the Respondents to commence an investigation into the incidents leading to the brutal murder of 27 prisoners inside the Welikada Prison.

24. The Petitioner states that the 1st Respondent is the Officer In overall charge of the Prisons, the 2nd Respondent is the Director of CID who is ostensibly in charge of the investigation, the 3rd Respondent being the head of the Department of Police, the 4th Respondent is the Minister within whose purview lies the entire Prison Authority. The 4th Respondent is cited by virtue of being the Chief Legal advisor of the State.

25. The Petitioner state that he has not invoked the jurisdiction of Your Lordships Court previously in this matter.

**WHEREFORE THE PETITIONER PRAYS FOR:**

a) Notice to issue on Respondents,

b) Issue a Writ of Mandamus on the 2nd and 3rd Respondents commanding them to commence according to law the investigations into the incidents on 9th and 10th December 2012 in the Welikada Prison resulting in the death of 27 Prisoners.

c) For such other and further relief that to Your Lordships shall seen meet.

**Attorney at Law for the Petitioner**

# අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුව වෙත ඉදිරිපත් කරන පැමිණිල්ල.

[illegible]ාරාමය, රබර්වත්ත පාර, පේරගහවත්ත, 397/එෆ් හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 730193063V හිමි වැල්ලගේ සුදේශ් නන්දිමාල් සිල්වා සිංහල බෞද්ධ විවාහක දුරකථන අංක 071 4253518 වන වර්ෂ 2012 නොවැම්බර් මස 09 වන දින වැලිකඩ බන්ධනාගාරයේ රැඳවියෙකුව සිටියදී ආරක්ෂක අංශ සාමාජිකයන් විසින් රැඳවියන් 27 දෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධියට අදාලව රැඳවියන් දෙදෙනෙකු ඝාතනය කරනු ඇසින් දුටු සාක්ෂිකරුවෙකු වශයෙන් එහි අපරාධය පිළිබඳව වහාම පරීක්ෂණ ආරම්භ කර සැකකරුවන් අත්අඩංගුවට ගෙන නිසි අධිකරණයට ඉදිරිපත් කරන ලෙසත්, මෙම අපරාධය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරන ලෙසත් අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුවෙන් ඉල්ලා සිටිමි. මා වර්ෂ 2007.05.25 දින සිට 2013.09.19 දින දක්වා ත්‍රස්තවාදය වැලැක්වීමේ පණත යටතේ අත්අඩංගුවට ගෙන සැකකරුවෙකු වශයෙන් රක්ෂිත බන්ධනාගාර ගතව සිටියෙමි. මෙකී අපරාධය සිදුවන දිනයේදී එනම් 2012 නොවැම්බර් 09 වන දින සහ ඊට ආසන්න සෑම දිනකම නේවාසික රැඳවියෙකු වශයෙන් මෙකී සිද්ධිය සිදු වූ වැලිකඩ බන්ධනාගාරයේ සිටි බව ප්‍රකාශ කර සිටිමි. ඒ අනුව 2012 නොවැම්බර් 09 වන දින වැලිකඩ බන්ධනාගාරය තුලට රජයේ ආරක්ෂක අංශ විසින් ආයුධ සන්නද්ධව පැමිණ සිරකරුවන් 27 දෙනෙකු ඝාතනය කිරීම සහ සිරකරුවන් විශාල පිරිසකට තුවාල සිදු කිරීම සියැසින්ම දුටු අයෙකු බව ප්‍රකාශ කර සිටිමි. මෙකී සිද්ධිය නිසා මා බලවත් මානසික කම්පනයකටත් මානසික පීඩනයකටත් ලක් වී සිටිමි. වර්ෂ 2013.09.19 වන දින මා නිදහස්ව එළියට පැමිණියත් එවකට තිබූ සමාජ පසුබිම සහ ආණ්ඩු පක්ෂය විසින් ක්‍රියාත්මක කරගෙන යමින් තිබූ මර්ධනකාරී ක්‍රියාමාර්ග නිසා මෙකී අපරාධය සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට මා බියෙන් පසුවුනෙමි. එසේම මේ සම්බන්ධයෙන් එවකට සිටි රජය විසින් කොමිසමක් පත් කළ බව මා දැනගත් නමුත් එකී කොමිසමෙන් මෙසේ ඝාතනය වූ රැඳවියන්ට හෝ ඔවුනගේ ඥාතින්ට හෝ මා හට සාධාරණයක් ඉටු වී නැත. තවදුරටත් මා ප්‍රකාශ කර සිටින්නේ 2012 නොවැම්බර් 18 වන දා ඉරිදා ලංකා පුවත්පතට අනුව එසේ ඉහත කී කොමිසමෙන් සාධාරණයක් ඉටු වී නොමැති බවයි. එසේම මෙකී මියගිය රැඳවියන්ගේ ඥාතින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහ අදාල අනෙකුත් බලය සහිත ආයතන වලට මෙකී ඝාතන සම්බන්ධයෙන් පැමිණිලි කර තිබුණත් මෙම සිද්ධිය සම්බන්ධයෙන් මේ දක්වා කිසිම සාධාරණයක් හෝ සහනයක් ලැබී නොමැත. බන්ධනාගාරය තුල අධිකරණය සහ රජය භාරයේ සිටින නිරායුධ රැඳවියන් මේ ආකාරයෙන් නීති විරෝධී ලෙස ඝාතනය කිරීම ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් උල්ලංඝනයක් කිරීම බව මා ප්‍රකාශ කර සිටිමි. මා දැනගත් කරුණු අනුව මෙසේ ඝාතනය කිරීම කර ඇත්තේ හිටපු ආරක්ෂක ලේකම්ගේ ලැයිස්තුවක් අනුව බවත් ඝාතනය කරන ලද බොහෝ රැඳවියන් එවකට පැවති රජයට සහ ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ කොට්ඨාශයේ පොලිස් නිළධාරී රංගජීව යන අයට විරුද්ධව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කර ඇති අය බවත් පැහැදිලිය. ඒ අනුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර මිය ගිය රැඳවියන්ටත් ඔවුන්ගේ ඥාතින්ටත් මාහටත් සාධාරණය ඉටු කර ගැනීම සඳහා මෙම ඝාතනයේ වගකිවයුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ලෙස මෙම පැමිණිල්ලෙන් මා ඉල්ලා සිටිමි.

P1A

පොලිස් පෝරම අංක I. B

පැමිණිලි ලදුපත
முறைப்பாடு ஏற்றுக்கொள்ளல்
Acknowledgement of Complaint

| | |
|---|---|
| පොලිස් ස්ථානය<br>பொலிஸ் நிலையம்<br>Police Station | |
| දිනය<br>திகதி<br>Date | |
| පැමිණිලිකරුගේ නම<br>முறைப்பாடு செய்பவரின் பெயர்<br>Name of Complainant | [illegible] |
| පැමිණිල්ලේ ස්වභාවය<br>முறைப்பாட்டின் வகை<br>Nature of Complaint | [illegible] |
| තොරතුරු පොතේ යොමුව<br>தகவல் புத்தக விபரம்<br>I. B. Reference | 02/2015 ........ 2015/12/12) |
| සටහන් කරන නිලධාරියාගේ අත්සන<br>முறைப்பாடு பதிபவரின் கையொப்பம்<br>Signature of Recording Officer | [signature] 27312 |
| සටහන් කරන නිලධාරියාගේ නම, තනතුර හා නිල අංකය<br>முறைப்பாடு பதிபவரின் பெயரும் பதவியும் பதிவிலக்கமும்<br>Name Rank & Reg. No. of Recording Officer | [illegible] 27312<br>H. A. [illegible] |

H 042187 – 1,000 (2013/06)P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

P2

<u>කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.</u>

05 JUL 2016

ස්ථානාධිපති,

අපරාධ විමර්ශන අංශය,

පොලිස් ස්ථානය,

බොරැල්ල.

<u>- පැමිණිලිකරු -</u>

නඩු අංකය :- <u>බී/6540/02/12</u>

<u>එරෙහිව</u>

01. වීරක්කොඩිගේ ඩෙස්මන් උපාලි සිල්වා.

02. අමරසිංහ ආරච්චිලාගේ සමීර අමරසිංහ.

03. ලියන ආරච්චිලාගේ අයිටන්.

04. උළුවඩුගේ අසන්ත.

05. මඩවිත විතානගේ උදිය දමාල් පෙරේරා.

06. කුරුවිට ආරච්චිලාගේ අජිත් මංජු කුමාර.

<u>- සැකකරුවන් -</u>

ස්ථාන පරීක්ෂණය සහ මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කරන ලදී.

සටහන් බලන්න.

වැඩිදුර මරණ පරීක්ෂණය 2012/11/28

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**202.11.28**

මරණ පරීක්ෂණ සාක්ෂි

**2012.11.13**

සැකකරු :- හේවා බැට්ටගේ තුෂාන් සාරද / වන්න.

සැකකරු 2012/11/21 (රි)

අත්/කළේ,.

මහේස්ත්‍රාත්.

**2012.11.10**

සැකකරු :-

1. වීරක්කොඩිගේ ඩෙස්මන් උපාලි සිල්වා
2. අමරසිංහ ආරච්චිලාගේ සමීර අමරසිංහ
3. ලියන ආරච්චිලාගේ අයිවන්
4. උළුවඩුගේ අසංක
5. මඩවිත විතානගේ උදය දමාල් පෙරේරා

} සිටී.

6. කුරුවිට ආරච්චිලාගේ අජිත් මංජු කුමාර - සිටී.

1 – 6 සැකකරුවන් 2012/11/21 (රි)

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

05 JUL 2016

**2012.11.12**

මෙම නඩුවට වැඩිදුර වාර්තාවක් ඉ/කරමින් බොරැල්ල පොලිස් ස්ථානාධිපති, මෙම නඩුවේ වැඩිදුර විමර්ෂණ සඳහා, සංස්කරණය නොකරන ලද සහ සංස්කරණය කරන ලද වීඩියෝ පට හා සංස්කරණය නොකරන ලද ඡායාරූප සහ පුවත්පත්වල පලකරන ලද ඡායාරූප ද, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මහජන පැමිණිලි අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක උන්දුක ද සිල්වා මහතාට හෝ ඔහු නම් කරනු ලබන නිලධාරියෙකුට ලබා දෙන ලෙස දෙරණ, ස්වර්ණවාහිණී, ජාතික රූපවාහිනී, සිරස මාධ්‍ය ජාලය, ස්වාධීන රූපවාහිනී, TNL, TV ලංකා, මැක්ස් TV, ශ්‍රීවිව්, හිරු TV, සියත TV, ආර්ට් TV යන නාලිකාවල ප්‍රවෘත්ති අධ්‍යකෂවරුන් වෙත ද, තිනකුරල්, ඒඩ් ගෝරියන්, උපාලි පුවත්පත් සමාගම, ලීඩර් හෝල්ඩිං පුද්ගලික, රිවිර මාධ්‍ය ජාලය, විජය ප්‍රවෘත්ති පත්‍රස මාගම, සි/ස ලක්බිම පුවත්පත් සමාගම, ද නේෂන් හෝල්ඩිංස්, සුමති පුවත්පත් සමාගම, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන පුවත්පත් ආයතනවල ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරුන්ට ද නියෝග නිකුත් කරන ලෙස අයදී.

1. ගොනු කරන්න.

2. ඉල්ලා ඇති පරිදි නියෝග නිකුත් කරමි.

3. ප්‍රගතිය සඳහා නඩුව කැඳවන්න.

කැඳවන්න 2012/11/21

අත්/කලේ,..

මහේස්ත්‍රාත්.

පරීක්ෂා කළා විධිමත්ය.

..... අත්සන් කර ඇත. 11/12

**2012.11.21**

සැක :- (1) W. ඩෙස්මන් උපාලි සිල්වා (රි)

(2) A.A. සමීර අමරසිංහ (රි)

(3) L.A. අයිවන්

(4) උළුවඩුගේ අසන්ත (රි)

(5) M.W. උදිත දමාල් පෙරේරා (රි)

(6) K.A. අජිත් මංජු කුමාර (රි)

(7) H.B. තුෂාන් නාරද (රි)

සිටී.

පැමිණිල්ල

කැඳවන්න

1 – 7 සැකකරුවන්ට රු.ලක්ෂය බැගින් ශරීර ඇප 2 ක් එක් අයෙකුට.

කැඳවන්න 2013/2/6

අත්/කලේ,..

මහේස්ත්‍රාත්.

**2012.11.22**

රයිගමගේ සුසන්ත පෙරේරා, මොහමඩ් සලාහුදීන් මොහමඩ් අස්වර්ඩීන්, චින්තාමලි මොහොට්ටිගේ තුෂාර චන්දන හෙවත් කලුතුෂාර, රමානාදාන් බාලු පෙරුමල් යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා වෛද්‍ය U.A.K. තෙන්න

කෝන් මහතා විසින් එවා ඇත.

05 JUL 2016

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2012.11.28

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

ප.ම.ප.වා. ගොනු කළා.
... අත්සන් කර ඇත. 11/23

**2012.11.26**

වැලිගම තුප්පහිගේ අසංක උදය කුමාර යන අයගේ ප.ම.ප. වාර්තාව වෛද්‍ය D.I.L. රත්නායක මහත්මිය විසින් එවා ඇත.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2012.11.28

අත්/කළේ,...

මහේස්ත්‍රාත්තුමිය.

**2012.11.28**

වැඩිදුර මරණ පරීක්ෂණය

මරණකරුවන් විසිහය දෙදෙනකුගේ කෙටි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරයි.

මරණකරුවන් හතර දෙනෙකුගේ මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් අවසන්.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි 2012/12/12

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

මොහොමඩ් හමාර් මොහොමඩ් නවුෆර් යන මරණකරුගේ මරණයට හේතුව දැක්වූ වෛද්‍ය වාර්තාවේ සහතික පිටපත් මරණකරුගේ පියාට නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර්ට නියෝග කරමි.

අත්/කළේ,....

මහේස්ත්‍රාත්.

**2012.11.29**

මංගගේ සමන්ත ප්‍රනාන්දු,

ලියන ආරච්චිගේ අනුර,

මාම්පිට ආරච්චිගේ තිස්ස කුමාර

මොහමඩ් විජේ රෝහණ,

රත්නවීර පටබැඳිගේ ලෙස්ලි

D.M. සමීර පෙරේරා,

R.A.J. ලසන්ත යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ලැබී ඇත.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2012.12.12

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

05 JUL 2016

**<u>2012.12.19</u>**

2012.12.12 දින නීතිඥවරුන්ගේ වර්ජනය නිසා අද දිනට කැඳවන ලදී.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

SPGH-3423 ත්‍රිරෝද රථය තිළිණ චාමර මනෝජ් නිලධාරියාට මුදා හැරීමට නියෝග කරමි.

මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් අවසන්

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

කැඳවන්න 2013/01/23

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**<u>2012/12/19</u>**
SPGH-3423 ත්‍රිවිල් රථය භාර
ගැනීමේ ලිපිය භාරගත් බවට.... අත්සන් කර ඇත.
තිළිණ චාමර මානවඩු, "දිමුතු", හුබහවත්ත,
පිංකන්ද, දොඩන්දූව. ජා.හැ.අ. <u>853641685v</u>
2003/06/12

**<u>2012.12.28</u>**

මිය ගිය රඳවියකු වන (අංක 22) රණසිංහ ආරච්චිගේ ජනක ලසන්ත යන අයගේ බිරිඳ යැයි කියනු ලබන M.M. පුෂ්පරාණි යන අය සිය සැමියාගේ මරණ පරීක්ෂණ සහතිකය අයදී.

තවද වැලිකඩ බන්ධනාගාරයේ ජේලර් ද මෝෂමක් ඉ/කරමින් එම මරණ පරීක්ෂණ සහතිකයේ පිටපතක් අයදී.

මිය ගිය රැඳවියකු වන (අංක 17) සමීර මලිත් විජේසිංහ යන අයගේ මව යැයි කියනු ලබන මානෙල් විජේසිංහ යන අය මරණ පරීක්ෂණ සහතිකය අයදී.

තවද එම මරණයට අදාල මරණ පරීක්ෂණ සහතිකයේ පිටපතක් අයදී.

1. ගොනු කරන්න.
2. නියෝග ලබා දීමෙන් පසු ඉල්ලීම කරන්න.

05 JUL 2016

අත්/කළේ,...

මහේස්ත්‍රාත්තුමිය.

**2012.12.31**

ස්ථානාධිපති බොරැල්ල පොලිසිය මෝෂමක් ඉ/කරමින් මෙම නඩුව සඳහා නියෝගයන් ලබා ගැනීමට අද දින කැඳවන මෙන් අයදී.

නඩු භාණ්ඩ සම්බන්ධයෙන් මූලික සාක්ෂි ගොනු කරයි.

එකී නඩු භාණ්ඩ සම්බන්ධයෙන් රස පරීක්ෂක වෙත හා ජීන්ටෙක් ආයතනය වෙත යවා සංදේශය ගොනු කිරීමට

කැඳවන්න 2013/1/23

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

2012/12/31
භාණ්ඩ ර.ර.ප. සහ ජීන්ටෙක් ආයතනය වෙත යොමු
කරන ලදි...... අත්සන් කර ඇත.

**2012.12.31**

කොළඹ ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි ආනන්ද සමරසේකර මහතා ලිපියක් එවමින් මෙම නඩුවට අදාල වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටියදී මිය ගිය හඳුනා නොගත් එක් අයෙකුගේ මළ සිරුර පිළිබඳව මෙතෙක් ඥාතීන් ඉදිරිපත් වී නොමැති බවත් මෙම මෘත දේහය දැනට බොහෝදුරට කුණු වී ඇති බැවින් දුර්ගන්ධය හමන බවත් දන්වා සිටී.

මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානය බොරැල්ල විසින් මරණ පරීක්ෂණය පැවැත්වීමට නිසි පියවර නොගන්නේ නම් 2012.12.17 දින සිට සතියක් තුළදී රෝහලේ කොන්ත්‍රාත්කරු ලවා වල දැමීමට පියවර ගන්නා බැව් දන්වා සිටී.

1. ගොනු කරන්න.

2. දැනටමත් මහේස්ත්‍රාත් පරීක්ෂණය පවත්වා අවශ්‍ය නියෝග ලබා දී ඇත.

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

05 JUL 2016

**2013.1.7**

ජින්ටෙක් ආයතනයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ K.L. නන්දන පෙරේරා මහතා 2012.12.31 දාතමින් ලිපියක් එවමින් පැ1A, පැ1B, පැ1C, පැ2A, පැ33, පැ3, පැ2B, පැ2C, පැ5, පැ6, පැ10, පැ12, පැ13, පැ14, පැ15, පැ16, පැ17, පැ18, පැ27, පැ28, පැ29, පැ30 දරණ නඩු භාණ්ඩ උ.පො.ප. B.V. ජයරාජ් නිලධාරියාගෙන් භාරගත් බව වාර්තා කරයි.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2013.1.23

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

**2013.01.23**

සැක :- (1) W. ඩෙස්මන් උපාලි සිල්වා

(2) A.A. සමීර අමරසිංහ

(3) L.A. අයිවන්

(4) උළුවඩුගේ අසන්ත

(5) M.W. උදිත දමාල් පෙරේරා

(6) K.A. අජිත් මංජු කුමාර

(7) H.B. තුෂාන් නාරද

පැමිණිල්ල

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් අවසන්.

සටහන් බලන්න.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

කැඳවන්න 2013/2/6

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2013/02/06**

සැක :- (1) W. ඩෙස්මන් උපාලි සිල්වා ✓

(2) A.A. සමීර අමරසිංහ ✓

(3) L.A. අයිවන් ✓

(4) උළුවඩුගේ අසන්ත ✓

(5) M.W. උදිත දමාල් සිල්වා ✓

(6) K.A. අජිත් මංජු කුමාර ✓

(7) H.B. තුෂාන් නාරද ✓

05 JUL 2016

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි සඳහා කැඳවන්න

වැඩිදුර වාර්තා ගොනු කරයි.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් අවසන්.

සටහන් බලන්න.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

කැඳවන්න 2013/2/27

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2013.02.11**

K. ලතා ෆොන්සේකා යන අය මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ මිය ගිය තම පුතා වන මහගේ සමන්ත ප්‍රනාන්දු යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ පිටපතක් අයදී.

1. ගොනු කරන්න.

2. නියමිත ගාස්තු අයකර ගෙන සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

**2013.02.12**

මියගිය කපන්හලුපෙරුම ආරච්චිගේ පියරත්න හෙවත් S.K. තිලක් හේමචන්ද්‍ර යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව වෛද්‍ය P.B. දසනායක මහතා විසින් ඉ/කරයි.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2013.2.27

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

**2013/2/14**

නී/සරත් බණ්ඩාර මහතා මෝෂමක් ගොනු කරමින් මෙම නඩුව අද දින ගරු අධිකරණයේ කැඳවන මෙන් ඉල්ලා සිටී.

මෘත ශරීරය ඥාතීන්ට භාර දී ඇති බවට දන්වන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2013.02.27**

සැක :- (1) W. ඩෙස්මන් උපාලි සිල්වා
(2) A.A. සමීර අමරසිංහ
(3) L.A. අයිවන්
(4) උළුවඩුගේ අසන්ත
(5) M.W. උදිත දමාල් සිල්වා
(6) K.A. අජිත් මංජු කුමාර
(7) H.B. තුෂාන් නාරද

} සිටී.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

වැඩිදුර වාර්තා ගොනු කරයි.

වැඩිදුර මරණ පරීක්ෂණය අඩක් අවසන්.

සටහන් බලන්න.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි කැඳවන්න 2013/3/13

සැකකරුවන් ඉදිරිපත් වීම 2013/5/14

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

05 JUL 2016

**2013.03.11**

කොළඹ විශේෂඥ වෛද්‍ය ආනන්ද සමරසේකර මහතා අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත ලිපියක් යවමින් නීතිපතිතුමාගේ ඉල්ලීම පරිදි අ.ප.දෙ. වෙත, 2012.11.09 දින බන්ධනාගාරයේ සිදු වූ කලබලයේදී මිය ගිය අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවල පිටපත් මුද්‍රා තබා ඉල්ලා ඇති බැවින් ඒවා සති 2 ක් තුළ ලබා දෙන ලෙස ඉල්ලා ඇත. පිටපතක් මෙම අධිකරණය වෙත එවා ඇත.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2013.5.14

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ගොනු කරන ලදි.
... අත්සන් කර ඇත. 2013/03/11

**2013.03.13**

සැකකරුවන් ඉදිරිපත් කිරීමට 2013.05.14 දිනය ලබා දී ඇත.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

වැඩිදුර වාර්තා ගොනු කරයි.

මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් අවසන්.

සටහන් බලන්න.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

කැඳවන්න 2013/3/27

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

අද දින මරණ පරීක්ෂණ සාක්ෂි සටහන් ගොනු කළා.
2013/03/13

**2013.03.25**

කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි K.K. ප්‍රසර් මිය මෙම නඩුවේ පහත නම් අයගේ අධිකරණ වෛද්‍ය වාර්තා එවා ඇත.

1. අමරසේන
2. යකාහේවයලාගේ ප්‍රේමරත්න
3. බණ්ඩාර රාලලාගේ උපුල් ක්‍රිෂාන්ත
4. සුසන්ත
5. හතුරුසිංහ දේවගේ මදුරංග
6. A.G. තිලකසිරි
7. මොහමඩ් ජවුෆර්

8. නලීන්

9. නිසාන් සුජීව

10. අසංක

05 JUL 2016

11. විදානගේ D.S. සමරනායක

12. P.H. කපිල නිශාන්ත ද සිල්වා

13. චමින්ද පෙරේරා රූපසිංහ ආරච්චිගේ

14. ලෙවන්දගේ අනිල් රොහාන් පෙරේරා

15. මාලන් චන්ද්‍රදාස

16. චන්නි ආරච්චි කංකානමගේ විජිත සමන්ත

17. මෝගන් තඩරාජා

18. කොස්පිල වත්තගේ චන්දන පුෂ්පකුමාර

19. මදනායකගේ ලලිත් ප්‍රසන්න

20. නිශාන්ත

21. B.G.L. නිශාන්ත

22. මොහමඩ් අන්වර් මොහමඩ් ෆයිසාල්

23. D.K.D. ජයතිස්ස දෙමටපිටිය

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

1-23 වෛද්‍ය වාර්තා ගොනු කරන ලදී.
... අත්සන් කර ඇත. 2013/03/25

**2013/03/27**

සැක.:- (1) W. ඩෙස්මන් උපාලි සිල්වා

(2) A.A. සමීර අමරසිංහ

(3) L.A. අයිවන්

(4) උලවඩුගේ අසන්ත

(5) M.W. උදිත් දමාල් සිල්වා

(6) K.A. අජිත් මංජු කුමාර

(7) H.G. තුෂාන් නාරද

අධිකරණ වෛද්‍ය වාර්තා 23 ක් ලැබී ඇත.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් අවසන්.

සටහන් බලන්න.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි 2013/5/6

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2013.5.6**

සැක :- (1) W. ඩෙස්මන් උපාලි සිල්වා

(2) A.A. සමීර අමරසිංහ

(3) L.A. අයිවන්

(4) උලවඩුගේ අසන්ත

(5) M.W. උදිත දමාල්

(6) K.A. අජිත් මංජු කුමාර

(7) H.B. තුෂාන් සාරද

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි සඳහා

07/05/13 දින කැඳවීමට බොරැල්ල පොලිසිය ඉල්ලයි.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි ප.ව. 1.30 ට නිල මැදිරියේදී කැඳවන්න

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**<u>2013.5.7</u>** <u>ප.ව. 1.30 ට</u>

මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් මෙහෙයවා ඇත.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි සඳහා

සැකකරුවන් ඉදිරිපත් කිරීමට 2013.5.14 කැඳවීමේ දිනය ලබා දී ඇත.

බොරැල්ල අපරාධ අංශයේ ස්ථානාධිපති සිටී

එක් B වාර්ථාවකින් බොරැල්ල බන්ධනාගාරය 2012/11/09 දින සිදුව ගැටුමේදී මිය ගිය රැඳවියන් 27 දෙනා සම්බන්ධ මරණ පරීක්ෂණය සහ පැන ගිය රැඳවියන් සැකකරුවන් කරමින් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව අද දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ කොළඹ අපරාධ කොට්ඨාශයට මේ සම්බන්ධව දැනුම් දීමට බොරැල්ල අපරාධ

අංශයේ ස්ථානාධිපතිට දැනුම් දී ඒ සම්බන්ධයෙන් උපදෙස් නීතිපති දෙපාර්තමේන්තුවට දක්වා ඒ සම්බන්ධව ලිඛිත වාර්තාවන් ඉදිරිපත් කිරීමට නියෝග කරමි.

ගරු නීතිපතිතුමාට මේ සම්බන්ධයෙන් දැනුම් දී ඒ සම්බන්ධයෙන් අධිකරණයේ උපදෙස් පතන බව දැනුම් දීමට නියම කරමි.

18/06/13

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

<u>2013.05.07</u>

අගතියට පත් පාර්. නී/ඇන්ටන් සේනානායක ම/වරු මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ සම්පූර්ණ සහතික පිටපතක් අයදී.

1. ගොනු කරන්න.
2. නියමිත ගාස්තු අයකර ගෙන සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

<u>2013.05.10</u>

කොළඹ ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි ආනන්ද සමරසේකර මහතා, ඔහුගේ අංක 1LMT/09/11/2012 Welikada Prison incident හා 2013.4.18 දාතමින් සිහි කැඳවීමක් පශ්වාත් මරණ පරීක්ෂණ පැවැත්වූ වෛද්‍යවරුන් වෙත යොමු කරමින් අදාල පශ්වාත් මරණ පරීක්ෂණ වාර්තාවල රහස්‍ය පිටපත් ඔහු වෙත මේ දක්වා භාර දී නොමැති බවත්, එම වාර්තා ගොනු කිරීම සැලකිය යුතු කාලයක් ප්‍රමාද වී ඇති බවටත් ඒ

පිළිබඳව 2013.4.26 දිනට ප්‍රථම ක්‍රියා නොකිරීම මත ඇතිවන නීතිමය හා පරිපාලන ගැටළු පිළිබඳව එකී වෛද්‍යවරුන් විසින්ම වගකීම් භාරගත යුතු බවට සඳහන් කර ඇත. එකී ලිපියේ පිටපතක් ගරු අධිකරණය වෙත දැන ගැනීම සඳහා එවා ඇත.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2013.6.18

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

**2013/05/14**

සැක :- (1) ඩෙස්මන් උපාලි සිල්වා ✓

(2) A.A. සමීර අබේසිංහ ✓

(3) L.A. අයිවන් ✓

(4) උලවඩුගේ අසන්ත ✓

(5) M.W. උදිත උමාල් සිල්වා ✓

(6) K.A. අජිත් මංජුල කුමාර ✓

(7) H.G. තුෂාන් නාරද ✓ (සිර දඬුවම් නොවිඳි බන්ධනාගාර භාරයේ සිටී.)

සෙසු සැකකරුවන් වන රැඳවියන් දැනට සිර දඬුවම් විඳින බව දන්වයි. මෙම රැඳවියන් සම්බන්ධයෙන් බන්ධනාගාර පනත යටතේ ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වැලිකඩ බන්ධනාගාරයේ අධිකාරිට ඉදි/ට රෙජිස්ට්‍රාර්ට නි/කරන්න. ඉදිරි දින රැඳවියන් ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.

පොලිසිය රැඳවියන් සම්බන්ධයෙන් ලිඛිත වාර්ථාවන් ඉදිරිපත් කිරීමට නියම කරමි. අවශ්‍ය වුවහොත් රැඳවියන් ඉදිරිපත් කිරීමට දන්වමි

18/06/13

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

05 JUL 2016

නියෝගය දන්වා යවන ලදි.
.... අත්සන් කර ඇත.

**2013.05.30**

කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි H.D.S.C. ප්‍රසන්න අප්පුහාමි මහතා විසින්,

1. දේවරාජා මල්වරගේ සුගත් කුමාර
2. හේවා විතාරණගේ දිලුන් සන්ජීව රාජපක්ෂ
3. නිර්මල අතපත්තු
4. කංකානමගේ මලින්ද නිලේන්ද්‍ර පැල්පොල
5. සන්මු මංගල සුසන්ත ද සිල්වා යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා එවා ඇත.

1. ගොනු කරන්න.
2. සඳහන් කරන්න 2013.6.18

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

ප.ම.ප.ර. වාර්තා ගොනු කළා
... අත්සන් කර ඇත. 5/31

**2013.06.17**

වැලිකඩ බන්ධනාගාර අධිකාරි ඔහුගේ 2013.6.11 දිනැති අංක විලි/වැ/3/විවිධ/2013 දරණ ලිපිය සමඟ මෙම අධිකරණයේ 2013.5.14 දිනැති නියෝගය පරිදි අදාල සැකකරුවන් සම්බන්ධයෙන් ගත් පියවර දන්වා එවයි.

ඒ අනුව, (1) D. උපාලි සිල්වා

(2) A.A. සමීර අබේසිංහ

(3) L.A. අයිවන්

(4) උලුවඩුගේ අසන්ත

(5) W.M. උදිත දමාල් පෙරේරා

(6) K.A. අජිත් මංජු කුමාර යන සිරකරුවන් හට, බන්ධනාගාර ව්‍යවස්ථාපිත අණ පනත යටතේ බන්ධනාගාර නීත්‍යානුකූල අත් අඩංගුවෙන් පැනයාම සම්බන්ධයෙන් බන්ධනාගාර විනිශ්චය මණ්ඩලයෙන් දඩුවම් කර ඇති බවට, දඬුවම් බලපත්‍රවල සත්‍ය පිටපතක් බැගින් අමුණා ඇත.

7 වෙනි සිරකරු, සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා 2013.6.27 දින ගරු දිසා විනිසුරුතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බන්ධනාගාර විනිශ්චය මණ්ඩලයට චෝදනා ඉදිරිපත් කිරීමට නියමිත බව ද දන්වා ඇත.

1. ගොනු කරන්න.
2. සඳහන් කරන්න 2013.06.18

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

ලිපිය ගොනු කළා
.... අත්සන් කර ඇත. 6/17

**2013.6.18**

සැකකාර රැඳවියන් සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීමට පොලීසියට නියම කර ඇත.

පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා 27 ක් ලැබී ඇත. ගොනුකර ඇත.

මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් මෙහෙයවා ඇත.

සැක/ රැඳවියන් අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට නියම කර ඇත.

සැක/ රැඳවියන් සම්බන්ධයෙන්, බන්ධනාගාර පනත යටතේ ගෙන ඇති පියවර ගැන බන්ධනාගාර අධිකාරි එවූ ලිපිය ගොනුකර ඇත.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි සඳහා

2/7/2013

05 JUL 2016

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2013.06.18**

නී/N. මොහමඩ් අල්ලර් මහතා මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ මිය ගිය 11 වන මරණකරුගේ මරණ පරීක්ෂණ වාර්තාවේ, මුල් B වාර්තාවේ සහ 2013.6.18 දින කාර්යය සටහනේ සහතික පිටපතක් අයදී.

1. ගොනු කරන්න.

2. නියමිත ගාස්තු අයකර ගෙන සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..
මහේස්ත්‍රාත්තුමිය.

**2013.7.2**

පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා 27 ක් ලැබී ඇත. ගොනුකර ඇත.

මරණ පරීක්ෂණ සාක්ෂි අඩක් මෙහෙයවා ඇත.

යැක/රැඳවියන් අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට නියම කර ඇත.

යැක/රැඳවියන් සම්බන්ධව, බන්ධනාගාර පණත යටතේ ගෙන ඇති පියවර ගැන බන්ධනාගාර අධිකාරි එවූ ලිපිය ගොනුකර ඇත.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි සඳහා

රජයේ නීතිඥ මාධව තෙන්නකෝන් උපදෙස් පරිදි පොලිස් පරීක්ෂක ෆැන්සිස් මහතා කරුණු ඉදිරිපත් කරයි. කොළඹ අපරාධ ... (පැහැදිලි නැත) පොලිස් පරීක්ෂක රාජපක්ෂ .

වැඩිදුර වාර්ථාව අනුව බන්ධනාගාරයෙන් පැන ගිය රැඳවියන්ට බන්ධනාගාර පනත යටතේ නඩු පැවරීමක් කර ..... (පැහැදිලි නැත) දඩුවමින් ඇති බවත් එම නම් සඳහන් රැඳවියන් 7 දෙනා මෙම නඩුවෙන් නිදහස් කරමි. රැඳවියන් මිය යාම සම්බන්ධයෙන් පරීක්ෂණය පැවැත්වීමට නියමිතය. ඉදිරි දිනයේ මෙම පරීක්ෂණය සම්බන්ධ කටයුතු අ.ප.දෙ. පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසේකර මහතාට අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වීමට 16/07/13

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

05 JUL 2016

**2013.07.09**

R.W.M.C. රණවක යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අධිකරණ වෛද්‍ය K.K. ප්‍රසර් මිය විසින් ඉදිරිපත් කරයි.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2013.7.16

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

ගොනු කළා.
... අත්සන් කර ඇත. 7/10

**2013.7.16**

අ.ප.දෙ. පරීක්ෂන දෙපාර්තමේන්තුවේ ප්‍ර.පො.ප. වික්‍රමසේකරට අධිකරණයට ඉදිරිපත් වීමට නියම කර ඇත.

අ.ප.දෙ. ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මිය පැමිණ කරුණු දක්වයි. සැකකරු මොහමඩ් සලාහුඩීන් මොහමඩ් අස්වර් ඩීන් මරණකරු බිරිඳ පැමිණ සිටී. ...... (පැහැදිලි නැත) මෙහෙයවා අවසන් කර ඇත. මරණ සහතිකය ඉල්ලා සිටී.

නීතිඥ අතුලදේව මහතා මගින්

දැනට අවසන් වී ඇති .... (පැහැදිලි නැත)

ඒ අනුව මෙම සැකකරුගේ මරණයට හේතුව රයිෆල් උණ්ඩවලින් වෙඩි වැදී ඇති වූ තුවාලවලින් බව තීරණය කරමි. රෙජිස්ට්‍රාර් අවශ්‍ය පියවර ගන්න.

සැකකරුවන් සියලුදෙනා නීතිපති උදෘත නමන් යැවීමට රජයේ නීතිඥ මාධව තෙන්නකෝන් මහතාට මෙම පරීක්ෂණය සම්බන්ධ CR /17/2013 යොමු අංකය අනුව මෙම නඩුව සම්බන්ධයෙන් ප්‍රගතිය සම්බන්ධව අධිකරණය දැනුවත් කිරීමට අදාල රජයේ නීතිඥතුමාට ඒ බව ලිඛිතව දැනුම් දීමට රෙජිස්ට්‍රාර්ට නියෝග කරමි.

පිටපතක් අ.ප.දෙ. ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතාට නිකුත් කරමි.

01/10/13

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

මරණ සහතිකයේ මුල් පිටපත භාර ගතිමි.

[illegible] ෆාතිමා රිනෝසා (827300071v)

..... අත්සන් කර ඇත.

රජයේ අධි නීතිඥ මහතා වෙත ලිපිය නි/කළා.

... අත්සන් කර ඇත. 7/19

05 JUL 2016

**2013.07.18**

G.K. මාලනී යන අය මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ මිය ගිය නිර්මල අතපත්තු යන අයගේ මරණ සහතිකයේ පිටපතක් අයදී.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2013.10.01

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

**2013.08.28**

නීතිඥ අනෝමා පියතුංග මයා ඉහත නම් සඳහන් විත්තිකරුගේ මරණ සහතිකය ඉල්ලුම් කිරීමට ඉල්ලීමක් කිරීම සඳහා අද දින කැඳවන මෙන් ඉල්ලයි. (බන්ධනාගාරය තුළ මිය ගිය)

මිය ගිය අය - රත්නවීර පටබැඳිගේ ලෙස්ලි

ස්ථිර විනිසුරුතුමිය ඉදිරියේ ඉල්ලීම කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2013.09.03**

නීතිඥ රෝහණ දේශප්‍රිය මයා මිය ගිය රිමාන්ඩ් රැඳවියාගේ මරණ සහතිකය ඔහුගේ මව වන E.A. සිරියාවතී යන අයට ලබාදීමට කරුණු දැක්වීමට අද දින කැඳවන මෙන් ඉල්ලයි.

මිය ගිය අය - හර්ෂ මංජු ශ්‍රී මනකීර්ති

මෙම මරණකරුගේ මව E.D.සිරියාවතී පැමිණ මරණ සහතිකය ඉල්ලා සිටී. මරණකරුගේ මරණය සම්බන්ධව Cause of Death Form පැමිණ ඇති බැවින් මෙම මරණයට හේතුව රයිෆල් උණ්ඩවලින් වෙඩි වැදී ඇති වූ තුවාලවලින් බව දන්වා ඇති බැවින් මෙම අයගේ මරණයට හේතුව වී ඇත්තේ රයිෆල් උණ්ඩවලින් ඇති වූ තුවාලවලින් ඇති වූ මරණයක් බවට තීරණය කරමි. ඒ අනුව මරණ සහතිකය නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර්ට අවසර දෙමි.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

මරණ පරීක්ෂණ සහතිකය නි/කළා.
... අත්සන් කර ඇත.
භාර ගතිමි :- 595770343v
.... අත්සන් කර ඇත. ඊ.ඩී. සිරියාවතී

**(1) 2013.09.04**

නීතිඥ මිත්‍රපාල ජයසිංහ මයා K.H.H. සමීර මලිත් විජේසිංහ යන මරණකරුගේ මරණ සහතිකය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අද දින කැඳවන මෙන් ඉල්ලයි.

මරණකරු :- K.H.D. සමීර මලිත් විජේසිංහ

(2) නීතිඥ B.W. ගයනි දිල්රුක්ෂි මිය මරණ සහතිකය ලබා ගැනීම සඳහා නඩුව අද දින කැඳවන මෙන් ඉල්ලයි.

මරණකරු :- රත්නවීර පටබැඳිගේ ලෙස්ලි

(3) නීතිඥ රසික සංජීව මයා මරණ සහතිකය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට අද දින කැඳවන මෙන් ඉල්ලයි.

මරණකරු :- W.M. සරත් විජේසූරිය.

ඉදිරිපත් වී ඇති වෛද්‍ය වාර්තා අනුව මෙම මරණකරුවන් 3 දෙනාගේ මරණ රයිෆල් උණ්ඩවලින් ඇති වූ තුවාලවලින් සිදු වූ මරණ බවට තිරණය කරමි. ඒ අනුව මරණ සහතික නිකුත් කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

05 JUL 2016

**2013.09.04**

අපාධ විමර්ෂණ අංශයේ ස්ථානාධිපති බොරැල්ල මෙම නඩුවට මෝෂමක් ඉ/කරමින් රජයේ අධිනීතිඥ මාධව තෙන්නකෝන් මහතා වෙත නි/කළ ලිපියේ සහ 2013.7.16 දිනැති වැ/වාර්තාවේ සහතික පිටපතක් අයදී.

1. ගොනු කරන්න.

2. ගාස්තු රහිතව සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

W.M. සරත් විජේසූරියගේ මරණ සහතිකය
පිටපත ලබා ගතිමි.... අත්සන් කර ඇත.

K.W.D. සමීර මලිත් විජේසිංහගේ මරණ සහතිකය
ලබා ගතිමි.... අත්සන් කර ඇත.

R.P. ලෙස්ලි යන අයගේ මරණ සහතිකය ලබා ගතිමි.
.... අත්සන් කර ඇත.

**2013.09.10**

නි/දිනේෂ් ගොඩගම මයා මෙම නඩුවේ මිය ගිය වැල්ලගේ ලලන්ත විජේසිරි යන අයගේ මරණය සිදු වූ 2012.11.09 දින සිදු කරන ලද පශ්චාත් මරණ පරීක්ෂණයේ වාර්තා (කෙටි) ලැබී ඇත. ඒ සම්බන්ධ මරණ සහතිකය මරණකරුගේ බිරිඳ වන K.K. රේණුකා මල්කාන්ති යන අයට ලබා දෙන මෙන් ඉල්ලා සිටී.

1. ගොනු කරන්න.

2. අදාල මරණ සහතිකය මරණකරුගේ බිරිඳ වන K.K. රේණුකා මල්කාන්ති යන අයට නි/කරන්න.

මෙම මරණකරුගේ මරණය Cause of Death Form අනුව රයිෆල් උණ්ඩවලින් වෙඩි වැදී ඇතිවූ තුවාලවලින් සිදු වී ඇති මරණයක් බව තීරණය කරමි. ඒ අනුව මරණකරුගේ බිරිඳට මරණ සහතිකය නිකුත් කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

මරණ සහතිකය භාර ගතිමි.
... අත්සන් කර ඇත.
K.K. රේනුකා මල්කාන්ති 729154195 v

**2013.09.18**

නී/ජපිත කොඩිතුවක්කු මයා මෙම නඩුවේ 8 මරණකරුගේ මරණ සහතිකය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට කැඳවන මෙන ඉල්ලයි.

8 මරණකරු :- M. විජේ රෝහන

මෙම මරණකරුගේ වෛද්‍ය සහතිකය අනුව මරණයට හේතුව හිසට වැදුණු රයිෆල් උණ්ඩවලින් සිදු වූ මරණය බවට තීරණය කරමි.

වහාම රෙජිස්ට්‍රාර් මරණ සහතිකය නිකුත් කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

මරණ සහතිකය නි/කළා.
... අත්සන් කර ඇත. 9/18
m.p.s. දම්මිකා.... අත්සන් කර ඇත.

05 JUL 2016

**2013.10.01**

නඩුවේ ප්‍රගතිය අධිකරණයට දැනුම් දීමට රජයේ අධිනීතිඥ මහතාට ලිඛිතව දැනුම් දී ඇත. පිලිතුරු ලිපියක් ලැබී නැත.

රජයේ නීතිඥ මාධව තෙන්නකෝන් නමින් ප්‍රගතිය වාර්තාව ලිඛිතව ඉදිරිපත් කිරීමට මයාගේ අවධානය ගරු නීතිපතිතුමාට නි/කරමි. මෙම නඩුවට යොමු කිරීමට රෙජිස්ට්‍රාර්ට නියම කරමි.

පිටපතක් පොලිසියේ පො.කො. කුමාර 84.... (පැහැදිලි නැත) නිකුත් කරන්න.

11/12/14

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

නියෝගය දන්වා යවන ලදී.

.... අත්සන් කර ඇත. ... 10/9

පිටපත පො.කො. කුමාර වෙත යොමු කළා.
..... අත්සන් කර ඇත. 10/9

**2013.11.08**

මාරිමුත්තු පුෂ්පා යන අය මෝෂමක් ඉ/කරමින් මිය ගිය රණසිංහ ආරච්චිගේ ජනක ලසන්ත යන අයගේ මරණ පරීක්ෂණ වාර්තාව ලබා දෙන ලෙස අයදී.

1. ගොනු කරන්න.

මෙම මරණකරුගේ මරණය රයිෆල් උණ්ඩවලින් තුවාල වී සිදු වූ මරණයක් බව ඉදිරිපත් වූ සාක්ෂි හා වෛද්‍ය වාර්තාව අනුව තීරණය කරමි.

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

මාරිමුත්තු පුෂ්පා යන අයට මරණ පරීක්ෂණ සහතිකය ලබා දුනිමි.
.... අත්සන් කර ඇත. 2014/3/11
ලබා ගත් බවට ... අත්සන් කර ඇත.

**2013.12.10**

පැලියගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂක මහතා මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ මිය ගිය 2 වන මරණකරුගේ මරණයට අදාලව මරණ පරීක්ෂණ ෆෝර්මයේ පිටපතක් මහාධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා අයදී.

1. ගොනු කරන්න.

2. ගාස්තු රහිතව සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

05 JUL 2016

**2014.01.31**

ශී/දිනේෂ් දොඩංගොඩ මහතා මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ මිය ගිය ඇලන් විජේසිරි යන අයගේ මරණය සම්බන්ධව මරණ පරීක්ෂණයේ මරණ පරීක්ෂක තැනගේ සහතිකයේ සහතික පිටපතක් අයදී.

1. ගොනු කරන්න.

2. නියමිත ගාස්තු අයකර ගෙන සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,...

මහේස්ත්‍රාත්තුමිය.

**2014.02.10**

මියගිය අසිත සංජීව දිසානායක යන අයගේ මව වන K.S. තමරා නන්දනී යන අය මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ ඔහුට අදාල මරණ පරීක්ෂණ සහතිකය අයදී.

1. ගොනු කරන්න.

2. මරණයට හේතුව ප්‍රකාශයට පත්කර නොමැත. තහවුරු කර අයදින්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2014.02.11**

නඩුවේ ප්‍රගතිය අධිකරණයට දැනුම් දීමට රජයේ අධිනීතිඥ මයාට ලිඛිතව දැනුම් දී ඇත. ලිඛිත වාර්තාවක් ලැබී නැත.

මිය ගිය අසිත සංජීව යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ලැබී නැත.

මරණයට හේතුව සඳහන් කෙටි වෛද්‍ය වාර්තාව ගොනු කර ඇත.

මරණයට හේතුව ප්‍රකාශ කර නැත.

අසිත සංජීව දිසානායක යන අය පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව සඳහා නොතිසි නිකුත් කරමි.

පැමිණිල්ලේ පියවර සඳහා කැඳවමි 18.3.2014

අත්/කළේ,,..

මහේස්ත්‍රාත්.

පශ්.මරණ පරි. වා.නො/නි 2.11

**2014.02.12**

පැලියගොඩ අපරාධ විමර්ශණ අංශයේ ස්ථානාධිපති මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ මිය ගිය 2 වන තැනැත්තා වන රයිගමගේ සුසන්ත පෙරෝ යන අයගේ මරණය සම්බන්ධයෙන් වාර්තා කර ඇති වැඩිදුර වාර්තාවේ පැහැදිලි පිටපතක්, කොළඹ මහාධිකරණ අංක 1 හි 3721/7 දරණ නඩුවට ඉ/කිරීම සඳහා ගාස්තු රහිතව අයදී.

1. ගොනු කරන්න.

2. ගාස්තු රහිතව අදාල වැඩිදුර වාර්තාවේ සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමා.

**2014.3.18**

"ඇසිත සංජීව දිසානායක" යන මරණකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ලැබී නැත. නොතිසි නිකුත් කර ඇත. කෙටි වෛද්‍ය වාර්තාව ගොනුකර ඇත.

පැමිණිල්ලේ පියවර

05 JUL 2016

ඇසිත සංජීව දිසානායක යන අයගේ පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව සඳහා නොතිසි.

පැමිණිල්ලේ පියවර හා වැඩිදුර මරණ පරීක්ෂණය සඳහා කැඳවමි 10.6.2014

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

ප.ම.වා. නො.නි. කළා. 03/19 ... අත්සන් කර ඇත.

**2014.03.21**

වැලිකඩ බන්ධනාගාර ජේලර් ඔහුගේ අංක වැලි/ස්ථා/Q21517/2014 හා 2014.3.26 දාතමින් මෝෂමක් සමඟ ගරු මහාධිකරණ නියෝගයේ සත්‍ය පිටපතක් ඉදිරිපත් කරමින් මෙම නඩුවේ මිය ගොස් සිටින අයෙකු වන දේවමුල්ලගේ මලිත් සමිර පෙරේරා යන අයගේ මරණ පරීක්ෂණ වාර්තාවේ සහතික පිටපතක්, මහාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා අයදී.

1. ගොනු කරන්න.

2. ඉල්ලා ඇති පරිදි මහේස්ත්‍රාත්තුමිය පවත්වන ලද මරණ පරීක්ෂණ වාර්තාවේ සහතික පිටපත හා පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ සහතික පිටපත ගාස්තු රහිතව ලබා දෙන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**2014.05.21**

මහර බන්ධනාගාර අධිකාරි ඔහුගේ අංක මහර/ලිලි/3085/14 හා 2014.5.21 දිනැති ලිපිය සමහ මෙම නඩුවේ 3 වෙනි සැකකාර ලියන ආරච්චිගේ අයිවන් යන අය ගරු අධිකරණයට ඉදිරිපත් කරමින් දැනට ඔහු සිර දඩුවම් විදින නඩුවෙන් 14.5.20 දින නිදහස් වී ඇති බැවින් මෙම නඩුවට දැනටමත් නිකුත් කර ඇති 2014.5.14 දිනැති උසාවි නියෝගය අනුව, ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේද යන්න සම්බන්ධයෙන් නියෝගයක් අයදී.

1. ගොනු කරන්න.

3 සැකකරු :- ලියන ආරච්චිගේ අයිවන්

(මෙම සැකකරුව 2012.11.21 දින ගරු අධිකරණය විසින් රු:100,000/-) ශරීර ඇප (2) ක් නියම කර ඇති අතර එම ඇප එදිනම අත්සන් කර ඇත.)

පෙර ඇප මත මුදා හරිමි.

කැඳවමි 10.6.2014

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

5/21
බන්ධනාගාරයට ලිපිය නි/කළා.

**2014.6.10**

අසිත සංජීව දියානායක (මරණකරු) 05 JUL 2016

(වැඩිදුර මරණ පරීක්ෂණය)

මරණකරුගේ පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව සඳහා නොතිසි.

ලියන ආරච්චිගේ අයිවන් යන අයව අවශ්‍ය ද පිළිබඳව දැක්වීමට පැමිණිල්ලට නියම කරමි.

පැමිණිල්ලේ පියවර හා වැඩිදුර මරණ පරීක්ෂණය සඳහා කැඳවමි

19.8.2014

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

ප/ම/ප/වා/නො/කළා. ... අත්සන් කර ඇත.

**2014.06.19**

මිය ගිය දේවමුල්ලගේ මලිත් සමිර පෙරේරා යන අයගේ මව වන J.A. මර්ලින් යන අය මරණ පරීක්ෂණ සහතිකය අයදී.

1. ගොනු කරන්න.

2. මරණයට හේතුව ප්‍රකාශයට පත් කිරීම කර නොමැත. කරුණු දැක්වීම සඳහා කැඳවමි.

**2014.06.19**

මිය ගිය දේවමුල්ලගේ මලිත් සමිර පෙරේරා යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ සහතික පිටපතක් J.A. මර්ලින් යන අය අයදී.

1. ගොනු කරන්න.

2. නියමිත ගාස්තු අයකර ගෙන සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

**2014/06/27**

කොළඹ මහාධි/රෙජිස්ට්‍රාර්, අධිකරණයේ පෙනී සිටීමට නොතිසියක් ඉදිරිපත් කරමින් මෙම නඩු වාර්තාව 2014/08/07 දින ප.ව. 9.00 ට මහාධි/අංක 01 හි ඉදිරිපත් කරමින් පෙනී සිටින ලෙස අයදී.

1. ගොනු කරන්න.

2. නියෝගය

ඉදිරි දිනයේ මහාධිකරණයේ පෙනී සිට සාක්ෂි දීමට නියම කරමි රෙජිස්ට්‍රාර්.

අත්/කළේ,..
අති/මහේස්ත්‍රාත්.

**2014.07.15**

මහර බන්ධනාගාරයේ අධිකාරි ලිපියක් සමඟ වීරක්කොඩිගේ ඩෙස්මන් උපාලි සිල්වා යන සැකකරු ගරු අධිකරණයට ඉදිරිපත් කරයි.

2014.05.14 දින මෙම සැකකරු ගරු අධිකරණයේ ඉදිරිපත් කිරීමෙන් පසු "මෙම නඩුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට දැනුම් දෙමි" යනුවෙන් සටහනක් යොදා ඇති බැවින්, 2014.07.14 දින මොහු සියලු සමාවන් සහිතව නිදහස් වීමට නියමිතව ඇතත්, එසේ නිදහස් කිරීමට අපොහොසත් ඇති බව දන්වයි.

මෙම සැකකරු තවදුරටත් මෙම නඩුව සඳහා රඳවා ගත යුතු අයෙක්ද නැත්නම් මුදවා හැර ඇති අයෙක්ද යන්න පිළිබඳව සටහන් කර දන්වා ලෙස අයදී.

05 JUL 2016

ගරු මහේස්ත්‍රාත්තුමියෙනි,

2012.11.21 දින මෙම නඩුවේ සැකකරුවන් 1 - 7 දක්වා අයවළුන්ට රුපියල් ලක්ෂය බැගින් ශරීර ඇප (2) බැගින් නියම කර ඇතත් මෙම සැකකරු ඇපය අත්සන් කර නොමැත.

2013.5.14 දිනැති කාර්ය සටහන පරිදි සැකකරුවන් අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට දන්වමි යනුවෙන් සඳහන් කර ගරු අධිකරණය විසින් නියෝග කර ඇත.

2014.06.18 දිනැති B වාර්තාව මගින් (එහි අවසන් පේළියේ සිට 7 වෙනි වාක්‍යයේ) සැකකරුවන් මුදා හැරීමට පොලිසිය විසින් ඉල්ලීමක් කර ඇති බවට සටහන් වී ඇත.)

තවද බන්ධනාගාර අධිකාරි විසින් සපයා ඇති 2013.6.27 දිනැති ලිපිය පරිදි මෙම සැකකරුව Q 32086 යටතේ, මාස 8 ක සිර දඬුවමක් බන්ධ විනිශ්චය සභාව මගින් නියම කර ඇති බවට සටහන් වේ.

නියෝගය :-

2013.6.27 දින වාර්තාව ඉහත සැකකරු මුදා හැරීමට පැමිණිල්ල අයැද ඇත. ඔහුගේ දඬුවම් කාලය අවසන් බැව් පෙනේ. මෙම නඩුවට තවදුරටත් ඔහු අවශ්‍ය නොවන සැකකරුවකු බැව් බොරැල්ල පොලිසියේ පො.සැ. 29217 දිසානායක නිලධාරි පවසා සිටී. ඒ බැව් බන්ධනාගාර අධිකාරිට දැනුම් දෙන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

7/15
බන්ධනාගාර අධිකාරීට ලිපිය නි/කළා
වූදිත අවශ්‍ය නොවන බවට

**2014.8.19**

(1) W. ඩෙසමන් උපාලි සිල්වා

(2) A.A. සමීර අමරසිංහ

(3) L.A. අයිවන්

(4) උලවඩුගේ අසන්ත

(5) M.W. උදිත ලක්මාල්

(6) K.A. අජිත් මංජු කුමාර

(7) H.B. සුජාන් සාරද

2013.5.17 දිනැති කා/ස පරිදි මෙම සැකකරුවන් සම්බන්ධයෙන් බන්ධනාගාර පනත යටතේ කටයුතු කිරීමටත්, අවශ්‍ය වුවහොත් රැඳවියන් ඉදිරිපත් කිරීමටත් ගරු අධිකරණය විසින් නියෝග ලබා දී ඇත.

අද දිනට වැඩිදුර මරණ පරීක්ෂණය සඳහා සහ පැමිණිල්ලේ පියවර සඳහා නියමිතය.

ලියන ආරච්චිගේ අයිවන් යන සැකකරු සිටී. ඔහුගේ දඬුවම් අවසන් බැවි පැමිණිල්ල පිළි ගනී. මෙම නඩුවට ඔහුව තවදුරටත් අවශ්‍ය නොවන බැවි පැමිණිල්ල වෙනුවෙන් පො.සැ. 29217 දිසානායක නිලධාරී පවසයි. ඒ අනුව ඉහත අයව මුදා හරිමි.

වැඩිදුර මරණ පරීක්ෂණය සඳහා කැඳවම් 21.10.2014

අත්/කළේ,.
මහේස්ත්‍රාත්.

**2014.10.21**

පැමිණිලි මරණ පරීක්ෂණය

පැමිණිල්ල පැමිණ නැත.

10/12/2014

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

05 JUL 2016

**2014.12.10**

පැමිණිලි මරණ පරීක්ෂණය

පැමිණිලි මරණ පරීක්ෂණය සඳහා කැඳවමි

18.2.2015

අත්/කළේ,,.

මහේස්ත්‍රාත්.

**2015.02.11**

මිය ගිය චින්තාමනි මොහිනාට්ටිගේ තුෂාර චන්දන යන අයගේ මරණ පරීක්ෂණ සහතිකය ඔහුගේ පියා වන චින්තාමනි මොහට්ටිගේ රනිල් යන අය විසින් ඉල්ලා සිටී.

1. ලගොනු කරන්න.

2. මරණයට හේතුව ප්‍රකාශයට පත්කර නොමැත. ඉදිරි දිනට සඳහන් කරන්න.

අත්/කළේ,.

මහේස්ත්‍රාත්.

**2015.2.18**

අසිත සංජීව දිසානායක යන අයගේ පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ලැබී ඇත්දැයි පරීක්ෂා කර බලා වාර්තා කිරීමට රෙජිස්ට්‍රාර්ට නියම කරමි. මරණයට හේතුව ප්‍රකාශයට පත්කර නොමැති මරණකරුවන්ගේ නම් ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කිරීමට ද රෙජිස්ට්‍රාර්ට නියම කරමි. මහේස්ත්‍රාත් පරීක්ෂණ සටහන් ද, මරණ පරීක්ෂණ සාක්ෂි ද, පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ අධිකරණ වෛද්‍යවරයාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ද සැලකිල්ලට ගෙන චින්තාමනී මොහොට්ටිගේ තුෂාර චන්දන හෙවත් කළු තුෂාර යන අයගේ මරණය දුරක සිට, රයිෆල් ගිනි අවියකින් හිසට වෙඩි තැබීමෙන්, හිස් කබලට හා මොළයට දැඩි හානි සිදුවීමෙන්, එම සිදු වූ තුවාල හේතු කොට ගෙන ඇති වූ මරණයක් බවට තීරණය කරමි.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

ගරු නීතිපතිතුමා වෙත හා රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ මාධව තෙන්නකෝන් මහතා වෙත නඩුවේ ප්‍රගතිය සම්බන්ධ කරුණු වාර්තා කිරීමට ලිපිය නිකුත් කරන්න.

අසිත සංජීව දිසානායකගේ පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ලැබී නොමැති නම් නොතිසි නිකුත් කරන්න.

මරණ සහතිකයේ පිටපත (තුෂාර චන්දනගේ) පියාට ලබා දෙන්න ඉල්ලීම පරිදි.

සාක්ෂිකරුවන්ට නොතිසි

වැඩිදුර මරණ පරීක්ෂණ 24.3.2015

අත්/කළේ,.
මහේස්ත්‍රාත්.

අධිකරණ වෛද්‍ය නිලධාරී M.R.O. සුපියන් මහතා විසින් මිය ගිය
[illegible] යන අයගේ කෙටි වෛද්‍ය වාර්තාවන් පමණක් එවා ඇත.
පශ්චාත් ම.ප.ප.වා. ලැබී නොමැති බව ගෞරවයෙන් වාර්තා කරමි.
.... අත්සන් කර ඇත. 2/26

[illegible] පරීක්ෂණ සහතිකය බාර ගතිමි.
.. අත්සන් කර ඇත. 5022773496 v

ගෞරවනීය නිතිපතිතුමාට හා මාධව තෙන්නකෝන් මහතාට ලිපි නි/කළා.
.... අත්සන් කර ඇත. 2/27

**2015.02.24**

නි/J.A.M.S. චන්ද්‍රසේන මහතා මෝෂමක් ඉ/කරමින් මෙම නඩුවේ සම්පූර්ණ සහතික පිටපතක් අයදි.

1. ගොනු කරන්න.

2. නියමිත ගාස්තු අයකර ගෙන සහතික පිටපතක් නි/කරන්න.

අත්/කළේ,..

මහේස්ත්‍රාත්තුමිය.

2015.03.02.
දැනටමත් මරණ පරීක්ෂණ සහතික නි/කරන
ලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ලද එහෙත්
ප.ම.ප.වා. ඉල්ලුම් නොකළ සහ කෙටි වෛද්‍ය
වාර්තා පමණක් ලද අයගේ නාම ලේඛණය අඩංගු
ලේඛ/වාර්තාව ගොනු කළා. ....අත්සන් කර ඇත. 3/2

**2015.3.3**

රෙජිස්ට්‍රාර්,

වහාම පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ලැබී නොමැති අයගේ වාර්තා ඉදිරිපත් කිරීමට බොරැල්ල ස්ථානාධිපති ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී මඟින් ලිපිය නිකුත් කරන්න. (5, 6, 13, 14, 23) අනෙකුත් සියලු සාක්ෂිකරුවන්ට වහාම නොතිසි නිකුත් කරන්න.

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

සිතාසි නි/කළා. පිටපත, වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතාට නි/කළා. ... අත්සන් කර ඇත. 3/5.

## 2015.3.24

වැඩිදුර මරණ පරීක්ෂණය අඩක් අවසන්. පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ ලැබී නොමැති අයගේ එම වාර්තා සඳහා නොතිසි. අද දින නොකැඳවන ලද සියලුම සාක්ෂිකරුවන්ට නොතිසි නිකුත් කරන්න.

කැඳවම් 21.4.2015

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

මොහමඩ් නවුෆර්, පොන්නම්පෙරුම ආරච්චිලාගේ ප්‍රියන්ත, කේ.ඒ. ප්‍රියන්ත යන අයගේ පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා එවා ඇත. ඒවා මෙම නඩු වාර්තාවට ගොනු කිරීමට නියම කරමි.

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

නොලැබුණු පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවන්ට නොතිසි නිකුත් කළා.
2015.03.25

## 2015.04.10

JF120/15, (CF/352/12) (CF/390/12 හා CM/282/12 සම්බන්ධයි) හා 2015.3.30 දිනැතිව GH 3423 දරණ ත්‍රිරෝධ රථයට අදාලව රජයේ රස පරීක්ෂක විසින් වාර්තාවන් එවා ඇත.

1. ගොනු කරන්න.

2. සඳහන් කරන්න 2015.4.21

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

... ගොනු කළා. ... අත්සන් කර ඇත. 4/20

05 JUL 2016

**2015.04.21**

හදිසි මරණ පරීක්ෂණය

ඔ/0 ර/ද රථයට අදාලව රස පරීක්ෂක වාර්තා ගොනුකර ඇත.

ලැබී නොමැත. පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සඳහා හා කැඳවා නොමැති සාක්ෂිකරුවන්ට නොතිසි නිකුත් කරමි. සම්පත් ප්‍රනාන්දු, අයගෙ කුමාර, පි. ප්‍රියන්ත යන අයගේ සාක්ෂිකරුවන්ට නොතිසි.

කැඳවමි 13.5.2015

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

ලැබී නොමැති පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවලට හා කැඳවා නොමැති සාක්ෂි සඳහා නොතිසි නිකුත් කළා. 2015.04.22

5/05
කැඳවා නොමැති සාක්ෂිකරුවන්ට හා නොලැබී ඇති වෛද්‍ය වාර්තා කැඳවීමට සි/නි. කළා.
... අත්සන් කර ඇත. 5/8

**2015.4.24**

ස්ථානාධිපති, කොළඹ අපරාධ කොට්ඨාෂය දෙමටගොඩ මගින් මෝසමක් ගොනු කරමින් මෙම නඩුව කැඳවීමට අයදී.

කොළඹ අපරාධ කොට්ඨාශය මගින් කරුණු දක්වමින්, මෙම නඩුවේ පරීක්ෂණ සිදු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇති

බැවින් අපරාධ කොට්ඨාෂය භාරයේ ඇති ගිනි අවි හා උණ්ඩ රස පරීක්ෂක වෙත යොමු කරන තෙක් අධිකරණය භාරයේ තබා ගන්නා ලෙසට අයදී. ඒ අනුව නිසි පියවර ගන්නා තෙක් එම ආයුධ අධිකරණය භාරයට ගැනීමට අවසර දෙමි. එම භාණ්ඩ භාර ගැනීමට භාණ්ඩ භාරකරුට නියම කරමි.

කැඳවමි 13.5.2015

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

**2015.05.06**

වෛද්‍ය W.M.K.B. විජේතුංග මහතා මෙම නඩුවේ මිය ගිය මොහොමඩ් හමර් මොහොමඩ් නවුපර් යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව SR 1027/11/2012 SR අංකයෙන් එවා ඇත.

1. ගොනු කරන්න.

අත්/කළේ,..
මහේස්ත්‍රාත්.

**2015.5.13**

මොහොමඩ් ෆමර් මොහොමඩ් නවුෆර් යන මරණකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ගොනුකර ඇත. එම මරණකරුගේ සාක්ෂි මෙහෙයවා අවසන්. මරණ සහතිකය නිකුත් කර නැත. ලැබී නැති පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා හා කැඳවා නොමැති සාක්ෂිකරුවන්ට නොතිසි නිකුත් නිකුත් කර ඇත.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

(..)ඩී නොමැති පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සඳහා නොතිසි නිකුත් කරමි.

වැඩිදුර මරණ පරීක්ෂණය සඳහා කැඳවමි 26.5.2015

අත්/කළේ.,..

මහේස්ත්‍රාත්.

**<u>2015.5.26</u>**

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

(..)ඩී නොමැති පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සඳහා නොතිසි නිකුත් කරමි.

වැඩිදුර මරණ පරීක්ෂණ සඳහා කැඳවමි 3.6.2015

අත්/කළේ,..

මහේස්ත්‍රාත්.

**<u>2015.6.3</u>**

(..)ඩී නොමැති පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා/ට නොතිසි නිකුත් කර ඇත.

වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි

(..)ඩී නොමැති පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සඳහා නොතිසි.

P3

## INQUIRIES AND REPORTS

| No | Institution/Mechanism | Date of initiation | Status/Findings | Remarks |
|---|---|---|---|---|
| 1 | Criminal Investigation Department (CID) of the Police | 2012 | Pending. Current status is unknown | Had taken testimonies from prisoners including Sudesh Nandimal at the Welikada Prison around the week after the incident. Nadimal says they had not taken his full statement as the investigators had said "that is enough" at a point. |
| 2 | Commission appointed by the Former Minister of Rehabilitation and Prison Reforms Chandrasiri Gajadeera (A 3 Member Commission, comprising retired High Court Judge Bandula Attapattu, retired Deputy Inspector General(DIG) of police , Gunasena Thenabadu and Legal Officer of the Ministry of Prison Reforms, Mr.Lalith Andrahenndi | 2012 | The Interim of Final report has not been may public.<br><br>Interim report was reported to have been handed over to the Minister in February 2013 and the Final Report was reported as submitted to the Minister in November 2013.<br><br>The Minister was also quoted as saying the recommendations of this report couldn't be implemented as one Commissioner had disagreed with some of the recommendations made by | |

| | | | | |
|---|---|---|---|---|
| | | | the other two members. The report was also said to have stated that the prisoners had weapons and they had shot each other and that the lack of knowledge in using firearms and personal vendettas had led to the deaths of prisoners. | |
| 3 | Commission appointed by the Commissioner General of Prisons, P.W.Kodipili | 2012 | The report has not been made public was reported to have been submitted in November 2012.<br><br>Kodipili had dismissed the allegations that prisoners were called out by name in the early hours of 10th November 2012, and shot | |
| 4 | Investigation by Human Rights Commission of Sri Lanka (HRCSL) | 2012 | The Chairman of the HRCSL was reported to have told media that the HRCSL's investigation was put on hold base on a request by the Commissioner General of Prisons.<br><br>There have been no reports of the findings or publications of the report | |

| | | | | |
|---|---|---|---|---|
| 5 | The Committee of inquiry into the Prison incident 2012 (CIPI)<br><br>(Headed by retired Supreme Court Judge Wimal Nambuwasam and comprising retired. DIG Asoka Wijeyatillake, retired Administrative Official and Attorney-at- Law S.K.Liyanage) | 2015 | The report has not been made public. It has been reported to have been submitted to the present Prime Minister in June 2015 and the Minister of Justice had claimed it was then submitted to the Inspector General of Police (IGP).<br><br>The recommendations of this report have been published in 2015. | Nadimal had given evidence in front of this Commission |

P4 (a)

# දිවුරුම් ප්‍රකාශයයි.

දෙහිවල, කලුබෝවිල, ද සිල්වා පාර, අංක 22/3 දරණ ස්ථානයේ පදිංචි **ජයසිංහ ආරච්චිලාගේ මර්ලින්** (ජා.හැ.අංක : 195483003672) වන මම ක්‍රිස්තියානි භක්තිකාවක වශයෙන් පහත සඳහන් කරුණු සත්‍ය ලෙසත්, අවංකවත්, ගෞරව බහුමානයෙන් යුක්තව දිවුරා ප්‍රකාශ කර සිටින වගනම්,

01. ඉහත නම සඳහන් දිවුරුම් ප්‍රකාශිකාව මම වෙමි.

02. වර්ෂ 2012.11.09 වෙනි දින වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූහ ඝාතනයේදී මියගිය දේවමුල්ලගේ මලින් සමීර පෙරේරා යන අය මාගේ 3 වන පුත්‍රයා බව ප්‍රකාශ කර සිටිමි.

03. ඔහු වර්ෂ 2012.11.05 වන දින සිර දඬුවම් ලබා දීම සඳහා වැලිකඩ බන්ධනාගාරයට සිරකරු අංක Q 21517 යටතේ ඇතුලත් කර තිබූ බව ප්‍රකාශ කර සිටිමි.

04. මෙසේ සිටින විට වර්ෂ 2012.11.09 වන දින රාත්‍රියේදී ආයුධ සන්නද්ධව එකී වැලිකඩ බන්ධනාගාරය තුලට ඇතුලු වූ රජයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් විසින් සිදු කළ වෙඩි තැබීමක් නිසා ඉහත කී මාගේ පුත්‍රයා වන දේවමුල්ලගේ මලින් සමීර පෙරේරා යන අය ඝාතනය වූ බව ප්‍රකාශ කර සිටිමි.

05. මෙම ඝාතනය සෙවීම සඳහා වර්ථමාන රජය විසින් පත් කළ ත්‍රිපුද්ගල කමිටුවට මා සාක්ෂි ලබා දුන් බව ප්‍රකාශ කර සිටින අතර, එසේම මාගේ පුත්‍රයාගේ මරණය සම්බන්ධයෙන් ඥාතිසිටියක් වන බී.ටී.දුලාරි ජයවීර යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පිලිවෙලින් පැමිණිලි අංක HRC 1841/2012 සහ HRC 4400/12 යටතේ පැමිණිලි ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කර සිටිමි.

06. කෙසේ වෙතත් මාගේ පුත්‍රයා වන දේවමුල්ලගේ මලින් සමීර පෙරේරා යන අයගේ මරණය සම්බන්ධයෙන් සාධාරණයක් රජය විසින් පත් කළ ත්‍රිපුද්ගල කමිටුවෙන් හෝ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉටු වී නැති බව මා ප්‍රකාශ කර සිටිමි.

07. ඒ අනුව මා ප්‍රකාශ කර සිටින්නේ, මාගේ පුත්‍රයාගේ මරණය සම්බන්ධයෙන් මා දැඩි සේ මානසික කම්පනයට පත් වී ඇති බවත්, ඒ හේතුවෙන් මා අගතියට පත් වී ඇති බවත්ය.

ඉහත දක්වා ඇති කරුණු සියල්ල සිද්ධි ප්‍රකාශිකාව හට කියවා තේරුම් කර දුන් පසු එම ප්‍රකාශ සියල්ල සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන වර්ෂ 2017 ක්වූ මාර්තු මස 23 වන දින කොළඹ දී මා ඉදිරිපිට දී දිවුරා අත්සන් තැබූ බව සහතික කරමි.

සිද්ධි ප්‍රකාශිකාව

50.00

මා ඉදිරිපිටදීය

දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර
එස්. ඩී. එස්. ලියනගේ
සාම විනිසුරු
ලි.ප.අංක: 81/02/බප/කො/එල්/01
81/12, [illegible]

P4(b)

# දිවුරුම් ප්‍රකාශයයි.

නුගේගොඩ, මිරිහාන, පරණ කොට්ටාව පාර, අංක 26/12 දරණ ස්ථානයේ පදිංචි **මාලා ශිරන්ති පැල්පොල** (ජා.හැ.අංක : 557070478 V) වන මම බෞද්ධාගමිකයකු වශයෙන් පහත සඳහන් කරුණු සත්‍ය ලෙසත්, අවංකවත්, ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටින වගනම්,

01. ඉහත නම සඳහන් ප්‍රතිඥා ප්‍රකාශිකාව මම වෙමි.

02. වර්ෂ 2012.11.09 වෙනි දින වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූහ ඝාතනයේදී මියගිය මලින්ද නිලේන්ද්‍ර පැල්පොල යන අය මාගේ එකම පුතා බව ප්‍රකාශ කර සිටිමි.

03. ඔහු මිය යන තෙක් මරණ දණ්ඩනය නියම වූ සිරකරුවකු වශයෙන් වැලිකඩ බන්ධනාගාරයේ සිරකරු අංක L19844 යටතේ ඇතුලත් කර තිබූ බව ප්‍රකාශ කර සිටිමි.

04. මෙසේ සිටින විට වර්ෂ 2012.11.09 වන දින රාත්‍රියේදී ආයුධ සන්නද්ධව එකී වැලිකඩ බන්ධනාගාරය තුලට ඇතුලු වූ රජයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් විසින් සිදු කළ වෙඩි තැබීමක් නිසා ඉහත කී මාගේ පුතා වන මලින්ද නිලේන්ද්‍ර පැල්පොල යන අය ඝාතනය වූ බව ප්‍රකාශ කර සිටිමි.

05. මෙසේ තිබියදී 2012.11.09 වන දින වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ ඝාතන සම්බන්ධයෙන් විමර්ශණය කර බැලීම සඳහා වර්ථමාන රජය විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර එහි වාර්තාව රජයට ලබා දී ඇතත් මාගේ පුතා වන මලින්ද නිලේන්ද්‍ර පැල්පොල යන අයගේ මරණය සම්බන්ධයෙන් සාධාරණයක් එයින් ඉටු වී නැත.

06. ඒ අනුව මා ප්‍රකාශ කර සිටින්නේ, මාගේ පුතාගේ මරණය සම්බන්ධයෙන් මා දැඩි සේ මානසික කම්පනයට සහ සිත් වේදනාවට පත් වී ඇති බවත්, ඒ හේතුවෙන් මා අගතියට පත් වී ඇති බවත්ය.




ඉහත දක්වා ඇති කරුණු සියල්ල සිද්ධි ප්‍රකාශිකාව හට කියවා තේරුම් කර දුන් පසු එම ප්‍රකාශ සියල්ල සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන වර්ෂ 2017 ක්වූ මාර්තු මස 24 වන දින කොළඹ දී මා ඉදිරිපිට දී ප්‍රතිඥා දී අත්සන් තැබූ බව සහතික කරමි.

සිද්ධි ප්‍රකාශිකාව

මා ඉදිරිපිටදීය

24/03/2017

දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර
එස්. සී. එස්. ඉක්බාල්
සාම විනිසුරු
ලි.ප.අංකය: 81/02/බප/කො/එල්/0
81/12, බණ්ඩාරනායක මාවත
කොළඹ 12

# දිවුරුම් ප්‍රකාශයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 08, බොරැල්ල, මැගසින් පාර, අංක 60/T 1/A හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක: 463173117 V හිමි **වරාහේනගේ ගුණරත්න අල්විස් නොහොත් වරාහේනගේ සැමිසන් අල්විස්** වන මම බෞද්ධාගමිකයෙකු වශයෙන් අවංකවත්, සත්‍යවාදී ලෙසත්, ගරු ගාම්භීරතා පූර්වකවත් ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටින වග නම්,

1. ඉහත නම් සඳහන් ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.

2. වර්ෂ 2012.11.09 වන දින වැලිකඩ බන්ධනාගාරයේ සිදුවූ සමූහ ඝාතනයේදී මියගිය මොහොමඩ් විජය රෝහණ (සිර අංක 14427) යන අය මාගේ ඥාති පුත්‍රයෙක් බව ප්‍රකාශ කර සිටිමි.

3. ඉහත කී මොහොමඩ් විජය රෝහණ යන අය ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවමක් මත 2008 වර්ෂයේ වැලිකඩ බන්ධනාගාරයට සිර අංක 14427 යටතේ ඇතුලත් කර තිබූ බව ප්‍රකාශ කර සිටිමි.

4. මෙසේ සිටින විට වර්ෂ 2012.11.09 වන දින රාත්‍රියේදී ආයුධ සන්නද්ධව එකී වැලිකඩ බන්ධනාගාරය තුලට ඇතුළු වූ රජයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් විසින් සිදුකල වෙඩි තැබීමක් නිසා ඉහත කී මාගේ ඥාති පුත්‍රයා ඝාතනය වූ බව ප්‍රකාශ කර සිටිමි.

5. එසේම මෙම ඥාති පුත්‍රයාගේ ඝාතනය සම්බන්ධ අදාල වගකිවයුත්තන් නීතිය හමුවට පමුණුවන ලෙස රජයට බල කිරීමට "බන්ධනාගාර රැඳවියන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ කමිටුව" විසින් ක්‍රියාත්මක කළ සියළු විරෝධතා ව්‍යාපාරවලට සම්බන්ධ වී කටයුතු කර ඇති බව ප්‍රකාශ කර සිටින අතර ඒ සෑම අවස්ථාවකම මා මාගේ ඥාති පුත්‍රයාගේ මරණය සම්බන්ධයෙන් සාධාරණයක් බලාපොරොත්තුවෙන් සිටි බව ප්‍රකාශ කර සිටිමි.

6. මෙකී මරණය හේතුවෙන්ම දැඩි සේ මානසික පීඩනයට පත්වීම නිසා මාගේ බිරිඳ වන මොහොමඩ් සිරියාවතී යන අය අකාලයේ මරණයට පත්වූ බව ප්‍රකාශ කර සිටින අතර මේ සිද්ධිය නිසා මාද බලවත් මානසික කම්පනයට පත්ව සිටින බව ප්‍රකාශ කර සිටිමි.

7. මෙම ඝාතන සම්බන්ධයෙන් රජය විසින් පත්කල නිපුද්ගල කමිටුවේ වාර්තාව රජයට ලබා දී ඇතත් තවමත් සාධාරණයක් ඉටු නොවීම නිසා මා කනගාටුවට පත් වී ඇති බව ප්‍රකාශ කර සිටිමි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු )
මෙම දිවුරුම් ප්‍රකාශක හට කියවා තේරුම් )
කර දීමෙන් අනතුරුව එකී කරුණු නිවැරදි )
බවට පිළිගෙන මා ඉදිරිපිටදී වර්ෂ 2017 ක් )
වූ මාර්තු 23 මස වන දින කොළඹ දී ප්‍රතිඥා )
දී අත්සන් තබන ලදී. )

ශ්‍රී ලංකා SRI LANKA 50.00

දිවුරුම් ප්‍රකාශක

මා ඉදිරිපිටදී ය

**දිවුරුම් කොමසාරිස්, ස්වර්ණලතා පෙරේරා**
**මුළු දිවයිනටම සාම විනිසුරු**
**07/7/බප/මුද/106**
**393/7, පේර්ල වීදිය,**
**කොළඹ 12.**

P4(d)

# දිවුරුම් ප්‍රකාශයයි.

ගල්කිස්ස, සමුද්‍රාසන්න පෙදෙස, අංක : 31/14සී දරණ ස්ථානයේ පදිංචි **හේවා විතාරනගේ කුසුම්පාල රාජපක්ෂ** (ජා.හැ.අංක : 570883755 V) වන මම බෞද්ධාගමිකයකු වශයෙන් පහත සඳහන් කරුණු සත්‍ය ලෙසත්, අවංකවත්, ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටින වගනම්,

01. ඉහත නම සඳහන් ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.

02. වර්ෂ 2012.11.09 වෙනි දින වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූහ ඝාතනයේදි මියගිය හේවාවිතාරණගේ දිලුක් සංජීව රාජපක්ෂ යන අය මාගේ පුත්‍රයා බව ප්‍රකාශ කර සිටිමි.

03. ඔහු වර්ෂ 2012.11.09 දින වන විට ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් මාස 03 ක සිර දඬුවම් නියම කිරීම නිසා එකී දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා වැලිකඩ බන්ධනාගාරයට සිරකරු අංක 20701 යටතේ ඇතුලත් කර තිබූ බව ප්‍රකාශ කර සිටිමි.

04. මෙසේ සිටින විට වර්ෂ 2012.11.09 වන දින රාත්‍රියේදී ආයුධ සන්නද්ධව එකී වැලිකඩ බන්ධනාගාරය තුලට ඇතුලු වූ රජයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් විසින් සිදු කළ වෙඩි තැබීමක් නිසා ඉහත කී මාගේ පුත්‍රයා වන හේවාවිතාරණගේ දිලුක් සංජීව රාජපක්ෂ යන අය ඝාතනය වූ බව ප්‍රකාශ කර සිටිමි.

05. මියගිය මාගේ පුත්‍රයාගේ පශ්චාත් මරණ පරීක්ෂණයේදී මා ප්‍රකාශයක් ලබා දී ඇති අතර, මෘත ශරීරය භාර ගන්නා ලද්දේ මා විසින් බව ප්‍රකාශ කර සිටිමි.

06. මෙම ඝාතනය ඇතුලු අනෙකුත් ඝාතන සෙවීම සඳහා වර්ථමාන රජය විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර සාක්ෂි ලබා ගෙන කමිටු වාර්තාව රජයට ලබා දී දීර්ඝ කාලයක් ගත වී ඇතත් මේ මොහොත වන විටවත් එයින් මාගේ පුත්‍රයාගේ හෝ මියගිය අනෙක් අයගේ මරණ සම්බන්ධයෙන් සාධාරණයක් සිදු නොවූ බව ප්‍රකාශ කර සිටිමි.

07. ඒ අනුව මා ප්‍රකාශ කර සිටින්නේ, මාගේ පුත්‍රයාගේ මරණය සම්බන්ධයෙන් මා දැඩි සේ මානසික කම්පනයට සහ සිත් වේදනාවට පත් වී ඇති බවත්, ඒ හේතුවෙන් මා අගතියට පත් වී ඇති බවත්ය.

ඉහත දක්වා ඇති කරුණු සියල්ල සිද්ධි ප්‍රකාශක හට කියවා තේරුම් කර දුන් පසු එම ප්‍රකාශ සියල්ල සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන වර්ෂ 2017 ක්වූ මාර්තු මස 27 වන දින කොළඹ දී මා ඉදිරිපිට දී ප්‍රතිඥා දී අත්සන් තැබූ බව සහතික කරමි.

සිද්ධි ප්‍රකාශක

මා ඉදිරිපිටදීය

50.00

දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර

මුළු දිවයිනටම සාම විනිසුරු

07/7/බන/ඉද/108

233/7, [illegible]

P4(e)

# දිවුරුම් ප්‍රකාශයයි.

කොළඹ 14, ෆර්ගියුසන් පාර, අංක 33/42 දරණ ස්ථානයේ පදිංචි **අසරප්පුලිගේ සැලි නෝනා පෙරේරා** (ජා.හැ.අංක : 645133223 V) වන මම බෞද්ධාගමිකයකු වශයෙන් පහත සඳහන් කරුණු සත්‍ය ලෙසත්, අවංකවත්, ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටින වගනම්,

01. ඉහත නම සඳහන් ප්‍රතිඥා ප්‍රකාශිකාව මම වෙමි.


02. වර්ෂ 2012.11.09 වෙනි දින වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූහ ඝාතනයේදී මියගිය අසරප්පුලිගේ ජෝතිපාල පෙරේරා යන අය මාගේ 4 වන සහෝදරයා බව ප්‍රකාශ කර සිටිමි.

03. ඔහු වර්ෂ 2007 වර්ෂයේදී මරණ දඬුවම නියම වී වැලිකඩ බන්ධනාගාරයට සිරකරු අංක L 17877 යටතේ ඇතුලත් කර තිබූ බව ප්‍රකාශ කර සිටිමි.

04. මෙසේ සිටින විට වර්ෂ 2012.11.09 වන දින රාත්‍රියේදී ආයුධ සන්නද්ධව එකී වැලිකඩ බන්ධනාගාරය තුලට ඇතුලු වූ රජයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් විසින් සිදු කළ වෙඩි තැබීමක් නිසා ඉහත කී මාගේ සහෝදරයා වන අසරප්පුලිගේ ජෝතිපාල පෙරේරා යන අය ඝාතනය වූ බව ප්‍රකාශ කර සිටිමි.

05. මෙම ඝාතනය සෙවීම සඳහා වර්ථමාන රජය විසින් පත් කළ ත්‍රිපුද්ගල කමිටුවට මාගේ සහෝදරයකු වන අසරප්පුලිගේ ඉන්දික පෙරේරා යන අය සාක්ෂි ලබා දුන් බව ප්‍රකාශ කර සිටින අතර, දැනට දීර්ඝ කාලයක් ගත වී ඇතත් මාගේ සහෝදරයාගේ මරණය සම්බන්ධයෙන් එකී කමිටුව මගින්ද සාධාරණයක් වී නොමැති බව ප්‍රකාශ කර සිටිමි.

06. ඒ අනුව මා ප්‍රකාශ කර සිටින්නේ, මාගේ සහෝදරයාගේ මරණය සම්බන්ධයෙන් මා දැඩි සේ මානසික කම්පනයට පත් වී ඇති බවත්, ඒ හේතුවෙන් මා අගතියට පත් වී ඇති බවතීය.




ඉහත දක්වා ඇති කරුණු සියල්ල සිද්ධි ප්‍රකාශිකාව හට කියවා තේරුම් කර දුන් පසු එම ප්‍රකාශ සියල්ල සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන වර්ෂ 2017 ක්වූ මාර්තු මස 22 වන දින කොළඹ දී මා ඉදිරිපිට දී ප්‍රතිඥා දී අත්සන් තැබූ බව සහතික කරමි.

**සිද්ධි ප්‍රකාශිකාව**

**මා ඉදිරිපිටදීය**

**දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර**

**කේ. ඒ. ස්වර්ණලතා පෙරේරා**
**මුළු දිවයිනටම සාම විනිසුරු**
**07/7/බස/මුද/108**
**283/7, වෙල්ල වීදිය,**

P4(f)

# දිවුරුම් ප්‍රකාශයයි.

කැළණිය, පට්ටිය හන්දිය, නුවර පාර, දුම්රිය රක්ෂිතය, අංක : 692/10ඒ දරණ ස්ථානයේ පදිංචි **රයිගමගේ චන්ද්‍රිකා මාලනි පෙරේරා** (ජා.හැ.අංක : 605371744 V) වන මම බෞද්ධාගමිකයකු වශයෙන් පහත සඳහන් කරුණු සත්‍ය ලෙසත්, අවංකවත්, ගෞරව බහුමානයෙන් යුක්තව දිවුරා ප්‍රකාශ කර සිටින වගනම්,

01. ඉහත නම සඳහන් දිවුරුම් ප්‍රකාශිකාව මම වෙමි.

02. වර්ෂ 2012.11.09 වෙනි දින වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූහ ඝාතනයේදී මියගිය රයිගමගේ සුසන්ත පෙරේරා යන අය මාගේ සහෝදරයකු බව ප්‍රකාශ කර සිටිමි.

03. වර්ෂ 2012.11.09 දින වන විට ඔහු සැකකරුවකු වශයෙන් වැලිකඩ බන්ධනාගාරයේ සිරකරු අංක 1087 යටතේ ඇතුලත් කර තිබූ බව ප්‍රකාශ කර සිටිමි.

04. මෙසේ සිටින විට වර්ෂ 2012.11.09 වන දින රාත්‍රියේදී ආයුධ සන්නද්ධව එකී වැලිකඩ බන්ධනාගාරය තුලට ඇතුලු වූ රජයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් විසින් සිදු කළ වෙඩි තැබීමක් නිසා ඉහත කී මාගේ සහෝදරයා වන රයිගමගේ සුසන්ත පෙරේරා යන අය ඝාතනය වූ බව ප්‍රකාශ කර සිටිමි.

05. මෙම ඝාතනය සම්බන්ධයෙන් සාධාරණයක් සෙවීම සඳහා මා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇති බව ප්‍රකාශ කර සිටින අතර, ඒ සම්බන්ධයෙන් මා හට සාධාරණයක් ලබා නොදුන් බව ප්‍රකාශ කර සිටිමි.

06. කෙසේ වෙතත් මාගේ සහෝදරයා වන රයිගමගේ සුසන්ත පෙරේරා යන අයගේ මරණය සම්බන්ධයෙන් සාධාරණයක් රජය විසින් පත් කළ ත්‍රිපුද්ගල කමිටුවෙන් හෝ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉටු වී නැති බව මා ප්‍රකාශ කර සිටිමි.

07. ඒ අනුව මා ප්‍රකාශ කර සිටින්නේ, මාගේ සහෝදරයාගේ මරණය සම්බන්ධයෙන් මා දැඩි සේ මානසික කම්පනයට පත් වී ඇති බවත්, ඒ හේතුවෙන් මා අගතියට පත් වී ඇති බවත්ය.



ඉහත දක්වා ඇති කරුණු සියල්ල සිද්ධි ප්‍රකාශිකාව හට කියවා තේරුම් කර දුන් පසු එම ප්‍රකාශ සියල්ල සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන වර්ෂ 2017 ක්වූ මාර්තු මස 24 වන දින කොළඹ දී මා ඉදිරිපිට දී ප්‍රතිඥා දී අත්සන් තැබූ බව සහතික කරමි.

**සිද්ධි ප්‍රකාශිකාව**

**මා ඉදිරිපිටදීය**

**දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර**

කේ. ඒ. ස්වර්ණලතා පෙරේරා
මුළු දිවයිනටම සාම විනිසුරු
07/7/බප/මුද/108
283/4

P4 (9)

# දිවුරුම් ප්‍රකාශයයි.

දෙහිවල, කලුබෝවිල, රෝහල පාර, අංක 98/10 දරණ ස්ථානයේ පදිංචි **කාලවිල විතානගේ දෝන මානෙල් විජේසිංහ** (ජා.හැ.අංක : 636470732 V) වන මම ක්‍රිස්තියානි භක්තිකාවක වශයෙන් පහත සඳහන් කරුණු සත්‍ය ලෙසත්, අවංකවත්, ගෞරව බහුමානයෙන් යුක්තව දිවුරා ප්‍රකාශ කර සිටින වගනම්.

01. ඉහත නම සඳහන් දිවුරුම් ප්‍රකාශිකාව මම වෙමි.

02. වර්ෂ 2012.11.09 වෙනි දින වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූහ ඝාතනයේදී මියගිය සමීර මලිත් විජේසිංහ යන අය මාගේ ඥාති පුත්‍රයෙක් බව ප්‍රකාශ කර සිටින අතර, මා ඔහුගේ භාරකරු බව ප්‍රකාශ කර සිටිමි.

03. ඉහත කී සමීර මලිත් විජේසිංහ යන අයගේ පියා මියගොස් ඇති අතර, මවද ඔහුව අත්හැර ගොස් ඇති බවත්, ඒ අනුව කුඩා කාලයේ සිටම ඔහුව රැකබලා ගත්තේ මා විසින් බවත් ප්‍රකාශ කර සිටිමි.

04. ඔහු 2012 වර්ෂයේදී සැකකරුවකු වශයෙන් වැලිකඩ බන්ධනාගාරයට සිරකරු අංක 2403 යටතේ ඇතුලත් කර රඳවා තිබූ බව ප්‍රකාශ කර සිටිමි.

05. මෙසේ සිටින විට වර්ෂ 2012.11.09 වන දින රාත්‍රියේදී ආයුධ සන්නද්ධව එකී වැලිකඩ බන්ධනාගාරය තුලට ඇතුලු වූ රජයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් විසින් සිදු කළ වෙඩි තැබීමක් නිසා ඉහත කී ඥාති පුත්‍රයා වන සමීර මලිත් විජේසිංහ යන අය ඝාතනය වූ බව ප්‍රකාශ කර සිටිමි.

06. මෙම ඝාතනය සෙවීම සඳහා වර්ථමාන රජය විසින් පත් කළ ත්‍රිපුද්ගල කමිටුවට මා සාක්ෂි ලබා දුන් බව ප්‍රකාශ කර සිටින අතර, මේ වන විට එකී කමිටුවේ වාර්තාව රජයට ලබා දී ඇතත් එමගින් මියගිය ඥාති පුත්‍රයාට හෝ මා හට සාධාරණයක් නොවූ බව ප්‍රකාශ කර සිටිමි.

07. ඒ අනුව මා ප්‍රකාශ කර සිටින්නේ, මාගේ ඥාති පුත්‍රයාගේ මරණය සම්බන්ධයෙන් මා දැඩි සේ සිත් වේදනාවට පත් වී ඇති බවත්, මෙම මරණය සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට දඬුවම් නියම කිරීමටත් මා කැමැත්තෙන් සිටින බවත්ය.

ඉහත දක්වා ඇති කරුණු සියල්ල සිද්ධි ප්‍රකාශිකාව හට කියවා තේරුම් කර දුන් පසු එම ප්‍රකාශ සියල්ල සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන වර්ෂ 2017 ක්වූ මාර්තු මස 23 වන දින කොළඹ දී මා ඉදිරිපිට දී දිවුරා අත්සන් තැබූ බව සහතික කරමි.

ශ්‍රී ලංකා SRI LANKA 50.00

සිද්ධි ප්‍රකාශිකාව

මා ඉදිරිපිටදය

දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්වයකාර

එස්. සී. එස්. ඉක්බාල්
සාම විනිසුරු
ලි.ප.අංක: 81/02/බප/කො/එච්/01
81/12, බණ්ඩාරනායක මාවත